සැඳෑව
சந்தாவ

ශ්‍රී ලංකා
මහ බැංකු විශ්‍රාමිකයන්ගේ
සංගමය
2014 මැයි/ ජූලි කලාපය.

වෙබ් අඩවිය ඃ www.sendewa.org විද්‍යුත් ලිපිනය info@cbpa.com
අංක ඃ QD/168/News/2014 යටතේ ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලදී.






# “Ancient Sri Lanka: Centre of the Global Economy: Archaeological Evidence”

**Prof. Osmund Bopearachchi**

Called Lanka in the great Indian epic Ramayana - the Taprobane of the Greek and Latin authors and Serendib in the tales of Arab sailors - Sri Lanka, was a great centre of maritime commerce for 2500 years of its history. It owes this to its geographic location in the Indian Ocean, at the southern extremity of the Indian sub-continent, on the maritime routes between Arabia and China, to the advantages offered by natural ports, bays, estuaries, and navigable rivers facilitating the trade of its products such as beads, precious stones, tortoise shell, ivory, rice, honey, elephants, and, especially, spices, not only with the outside world, but also with the hinterland. The acquaintance of the world during the early historic period was limited to three continents : Europe, North Africa and Asia, therefore, the Indian Ocean was the only known Ocean to the navigators of the Western world. As a result, the island of Lanka became an inevitable destination of the mariners and the centre of the Indian Ocean trade.

The accounts given by classical authors about the Island of Lanka's trade with the outside world constitute a rich source of information. It was during Alexander the Great's expedition in India that Greeks such as Nearchos, Onesicritos, Aristoboulos, and, via them, Eratoshenes, became aware of the island of Taprobane after its ancient name *Tambapanni*). It was already known from the Export of its elephants to India. The discovery of the phenomenon of monsoons at the end of the Hellenistic era and the possibilities they offered to voyagers on the high seas resulted at the beginning of our era in the establishment of the first contacts with rome. At the end of the first century C.E. Pliny the Elder, already well informed about the island(VI, 81-91), referred to a delegation sent to Rome by the Sinhalese king at the time of Emperor Claudius (41-54). According to Pliny, this visit was the result of an accidental trip to Sri Lanka by an emancipated slave of the commercial tax farmer of the Red Sea. A corroborating indication is provided for approximately the same era by the Pali canon *Vamsattha Pakasini or Mahavamsa Tika*( 34, 13-16), according to which Sri Lanka sent ambassadors to the country of Romanuka(Rome). Ptolemy (second century C.E.) gives a number of details,often exact, on the situation and the geography of the country.

He mentions local products, and for the first time we find in his work a list of the towns of the island with indications of their location. Such precise knowledge of the country on the part of ptolemy shows that information reached him directly from merchants who had visited the Island. Cosmas, a sixth century CE Greek writer from Egypt, wrote in his *Christian Topography* : " This Sieledive, situated in a way at the heart of India .....receives from all markets and exports to all markets : it is a great commercial centre."

The present talk will be based on the recent archaeological evidence obtained from the ongoing project of the shipwreck dating back to the second BCE found five kilometres from the ancient port-site of Godavaya (Ambalantota), and also from the north and east coast very particularly, at Kandarodai, Neelagiriya, Deegavapiya and Kuchchaveli. The discovery of Black and Red Ware, Grey Ware, Rouletted Ware, Chinese porcelain, Roman, North and South Indian coins in these sites denote active trade activities.

Base on a lecture delivered recently at the CBSL Auditorium - Rajagiriya.

## ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමයේ නිලධාරි මණ්ඩලය - 2014


ගරු සභාපති
ලක්‍ෂමන් ද සිල්වා
මහතා


ගරු ලේකම්
ජයලාල් ජයවර්ධන
මහතා


ගරු භාණ්ඩාගාරික
මිලන් ප්‍රනාන්දු
මහතා


ගරු සමාජයීය ලේකම්
අයිරා වැගොඩපොල
මහත්මිය


ගරු උප සභාපති
ආරියදාස තන්ත්‍රිගේ
මහතා


ගරු උප ලේකම්
අමරපාල කරසිංහ
ආරච්චි මහතා


ගරු උප
භාණ්ඩාගාරික
ආර්.ඩී ගුණසේන
මහතා


ගරු විධායක
කමිටු සාමාජික
ලීලා මෝහන
සුන්දරම් මහත්මිය


ගරු විධායක
කමිටු සාමාජික
සේ. දො.
කරුණාරත්න මහතා


ගරු විධායක
කමිටු සාමාජික
ඩබ්.ඩී.ඒ.
රේමන්ඩ් මහතා


ගරු ගිණුම්
පරීක්‍ෂක -
කේ. ජෙගනාදන්
මහතා

# සංවත්සර මහා සභාවට පසු වදනක්

**ප්‍රවේශය :**

අතීතය වෙනස් කරන්න බැහැ. ඒක ස්ථාවරයි. ඒත් අනාගතය වෙනස් කරන්න පුළුවන්. ඒක නම්‍යශීලියි. අනාගතය නම්‍යශීලි වුණාට නිකං බලා හිටියොත් ඒකත් අතීතයට එකතු වෙලා ස්ථාවර වෙයි. ඒ නිසා අනාගතය සකස් කර ගැනීම සඳහා අතීතයට ආසන්නම වර්තමානයේදී කරන්න වැඩ ටිකක් තියෙනව. මේ මිනිස් නවාතැන, එහෙම නැත්නම් මේ ලෝකය, මේ මානව සමාජය මුළුමනින්ම වැඩ ලෝකයක්. මානව සමාජයේ හැම දෙයක්ම වැඩක්. වැඩවල එකතුවට තමයි මානව පැවැත්ම කියන්නේ. අතීතය තුළ ස්ථාවර වෙලා තියෙන්නෙ අන්න ඒ පැවැත්ම තමයි. මානව සංහතියේ බූදලය කියලත් ඒ අතීත පැවැත්මට කියන්න පුළුවන්. වඩාත් සුව පහසු වර්තමානය ගොඩනැගුවේ ඒ අතීතය තමයි. වර්තමානය නිර්මාණය වුනේ ඒ අතීතයේ කැපවීම නිසයි. ඒ අනුව වඩාත් සුව පහසුව කියන වත්මන් 'වත්කම' හෙවත් ''බූදලය'' වර්තමානයට උරුම කරල දුන්නේ ගල් ගැහුණු අතීතය විසිනුයි. අතෝරක් නැති වැඩ කන්දරාවක් කරමින් සිටින කොට සොබාදහමේ ඔරලෝසුකටුව දුන් සංඥාවට අනුව කල් පිරුණා. කල් පිරෙනවත් එක්කම අතීතයට තල්ලුවෙලා ගල් ගැහුණා. වර්තමානය සක්‍රීය වුණා. එහෙමනං වර්තමානය කියන්නේ පැත්තකට තල්ලුවෙලා ගල් ගැහුන අතීතයේ බාල සහෝදරයායි. නියමිත වැඩ කන්දරාව බාල දරුවා විසින් ලොකු දරුවාට වඩා පහසුවෙන් කරන විදිය මව්පියන් හැටියට සොබාදහම වෙනදා වගේම බලාගෙන ඉන්නවා. ස්වභාව ධර්මයේ සදාතනික නීතියට ගරු කරමින් ජීවත් වන, (අතීතයට එකතුවන) මිනිසාටත් හෙට දිනය ගැන හීන තියෙනවා. අල්ලට සිඟාවත් රස නැති කැවිලි කන ගමන් පවා හීන දකිනවා. ඒ හීන අතර එක එක මනෝ මූලික සංකල්ප තියනවා. ප්‍රජාතන්ත්‍රවාදයත් එහෙම සංකල්පයක්.

## මහා සභා රැස්වීම

දිය වෙමින්, ක්ෂය වෙමින්, කිළිටි වෙමින්, ජරාජීර්ණ වෙමින්, අජුව වෙමින් හෙවත් කෙටියෙන් කියනවා නම් කුණු වෙමින් යන 'ප්‍රජාතන්ත්‍රවාදය' කියන අගනා සමාජ පාලන උපක්‍රමයේ සකලවිධ මූලික ලක්ෂණ පෙන්නුම් කරමින් (ඒවා සුරකිමින්) අප ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ එකමුතුවක් ලෙස සැලකිය හැකි '**ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයන්ගේ සංගමයේ**' මහා සභා රැස්වීම 2014 අප්‍රේල් 27 වැනි දින ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජගිරියේ පිහිටි බැංකු අධ්‍යයන කේන්ද්‍රයේදී හෙවත් ''විදු පියස'' හි වන ශ්‍රවණාගාරයේදී පැවැත්වූවා.



පසුගිය විධායක කමිටුව එක පැයක්වත් වැඩිපුර ගත කරමින් බලය අල්ලාගෙන හිටියේ නෑ. නියමිත දවසට, නියමිත වෙලාවට, නියමිත විදියට ඉවත්ව ගියා. තියෙන නිලතලවල තවදුරට රැඳෙන්නත්, එහෙම නැත්නම් මහා සමාජයෙන් පරමාදර්ශ අරගෙන උපක්‍රමශීලීව යළිත් බලයට එන්නවත් ඉවත්ව ගිය විධායක කමිටුව කල්පනා කළේ නැහැ. සංගමයේ ව්‍යවස්ථාව නම්‍යශීලී ව්‍යවස්ථාවක් වුනත් ඒක සංශෝධනය කරමින් බලය රැකගෙන යළිත් පත්වෙන්න කල්පනා කළෙත් නැහැ. අන්න ඒ නිසා තමයි ප්‍රජාතන්ත්‍රවාදී මූලික ලක්ෂණ සියල්ලම මහා සභා රැස්වීම තුළ දිදුලමින් තිබුණෙ. මුළු ලෝකෙන්ම හොඳම ප්‍රජාතන්ත්‍රවාදි ලක්ෂණ තිබුණෙ බුදුන් වහන්සේ ධර්ම දේශනාකරන කාලෙ දඹදිව

හෙවත් ඉන්දියාවෙ ලිච්චවි රජ දරුවන්ගේ රාජ්‍ය-යේ විතරයි. හැබැයි ....? ඒත් අද අපේ සංගමය තුළත් යාන්තමට හරි ඉතුරු වෙලා තියෙනව. ඒකයි ඉවත් වෙලා නම්බු පිටින් යන්න හදන කොටත් සමහරුන්ට යන්න දුන්නෙ නැත්තෙ. ඒක තමයි සාමාජික විශ්වාසය. ඒක තමයි අති බහුතර කැමැත්ත. දැන් අළුතින් පත්වුනු නව විධායක කමිටුවට සිය සාමාජිකයන් වෙනුවෙන් කරන්න වැඩ ටිකක් තියෙනව.

## සාමාජික කෘතඥතාවය

සංවිධානයක ශක්තිය කියන්නෙ එහි අන්තර්ගත සාමාජිකත්වයට. සාමාජිකයන්ගෙ අදහස් උදහස් වලින් තමයි සංවිධානය සක්‍රීය වෙන්නෙ. සමගියෙන් රැස්වෙලා, සමගියෙන් වාඩිවෙලා, සමගියෙන් සාකච්ඡා කරල, සමගියෙන් තීරණවලට එළඹිලා, සමගියෙන් විසිරිලා යෑම සාමය සතුට කිරුළ දරන සමාජවල සාමාන්‍ය තත්ත්වයයි. සතුට පරම ධනයයි කියල තේරෙන්නෙ එතකොටයි.

2014 අප්‍රේල් 27 වෙනිදා මහ බැංකු විදු පියස වෙතට රැස්වුනු, මහ බැංකු ජ්‍යෙෂ්ඨ පුරවැසියන් තුළ සතුට, සැනසුම උතුරන්න වුනා.



''........අපේම තැනක්, එතන දැන් කොච්චර ලස්සනද ?, පියකරුද ? විඩිමත්ද ? '' කියල හැමෝම ආඩම්බරෙන් කථා කළා. වෙනද පිට තැන්වලදි තියපු සංවත්සර මහා සභාව අපේම තැනකට ගෙනාපු එක සතුටට ලොකු හේතුවක්.

**ඒ ගැන අධිපතිතුමාටත්, නියෝජ්‍ය අධිපතිතුමාටත්, සහකාර අධිපතිවරුන්ටත්, විදුපියසේ අධ්‍යක්‍ෂතුමා ඇතුළු උදව් කළ කාර්ය මණ්ඩලයටත්, විශේෂයෙන්ම ඉවත්ව යන විධායක කමිටුවටත් පැමිණි හැමෝම කෘතඥතාව පුද කළ බව හැබෑවක්.**

## සාමාජික සහභාගිත්වය

වෙනදා සංවත්සර මහා සභාවට සහභාගි වෙන්නේ වැඩිම වුනොත් සාමාජිකයන්ගෙන් 150 ක් විතර. ඒත්....... මෙවර මුළු ශාලාවම පිරෙන්න තරම්, ඒ කියන්නෙ 300 කට අධික පිරිසක් ඇවිල්ල සතුට බෙදා හදා ගත්ත.

එහෙම පැමිණි සංඛ්‍යාව වෙනදාට වඩා වැඩි වුනත්, නොපැමිණි සංඛ්‍යාව නම් වැඩියි. අපේ සමස්ත සාමාජික සංඛ්‍යාව 1013 ක් විතර වෙනව. ඒ වගේම වැන්දඹු හා අනත්දරු සාමාජිකාවන් 71 කුත් ඉන්නව. මේ අනුව පැමිණි සංඛ්‍යාව කුඩායි. හරයට වඩා ලවය ඉතාම කුඩාවීම සිරිතක්. විනෝද චාරිකාවකටවත් සහභාගී නොවන, වාර්ෂික මහා සභාවටවත් සහභාගී නොවන අති බහුතරය අතිශය පෞද්ගලික කරුනු මත සහභාගි නොවනවා වෙන්න පුළුවන්. ඒත් ඔවුහු පොදුවේ ප්‍රජාතන්ත්‍රවාදය නම් අපේක්‍ෂා කරනවා.

ඒක මුළු රටේම හැටියක් කියල හිතෙනව. මහා සමාජයේ ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාව 100 යි. ඒත් මැතිවරණයකදී ඡනදය පාවිච්චි කරන්නෙ 60 ක් විතර. ඡන්දෙ පාවිච්චි නොකරපු 40 ත් යහපාලනය හා ප්‍රජාතන්ත්‍රවාදය බලාපොරොත්තු වෙනව. සිය ඡනදය පාවිච්චි නොකිරීමට විවිධ හේතු තියෙන්න පුළුවන්. විශ්වාසයක් නැතිකම, රවටනු ලැබීමට අකමැතිවීම, බොරු පොරොන්දුවලට තරහ යෑම, කලකිරීම, කාලය නාස්ති කර ගැනීමට නොකැමතිවීම වගේ හේතු සාධක රාශියක් මහා සමාජය තුළින් විද්‍යමාන වෙන්න පුළුවන්.

ඒත් අපේ සංවත්සරික මහා සභාවට නොපැමිණීමට නම් එහෙම හේතුවල බලපෑමක් වෙන්න බැහැ. මොකද මෙතන ලිච්චවි රජදරු-

වන්ගෙ වගේ 'සැබෑ ප්‍රජාතන්ත්‍රවාදි ලක්ෂණ' පැලපදියම් වෙලා තියෙනවා. ඒ නිසා බොහෝ දෙනෙක් මහා සභාවලට සහභාගි නොවෙන්නෙ සෞඛ්‍ය ප්‍රශ්න, ප්‍රවාහන ප්‍රශ්න හා අති ප්‍රබල ලෙස ආර්ථික ප්‍රශ්නවල පීඩනය නිසාමයි. බලන්න මේ උදාහරණය තුළින් සැබෑව........?

## උදාහරණයක්

හොඳම උදාහරණයක් වශයෙන් අප විශ්‍රාමික සංගමයේ කටයුතුවලට ඉතාමත් කැමති, උද්‍යෝගිමත් සාමාජිකයෙක් එවපු ලිපියක් දැක්විය හැකියි. ඔහු නිල්වලා ගඟෙනුත් එගොඩහා, සාමාජිකයෙක්. සංවත්සර මහා සභාවට පැමිණීමට නොහැකිවීම ගැන ලිපියකින් දැනුම්දීල තියෙනව. ඔහුගේ නොපැමිණීමට හේතුව අතිශය සංවේදී කාරණයක්. ඔහුට K.....ප්‍රදේශයේ සිට කොළඹට යාමට ඒමට හා දිවා ආහාරය සඳහා ගෙවිය යුතු මුදල ද ඇතුළු රුපියල් 2000/- ක් සොයා ගැනීමට නොමැතිවීම නිසායි එන්න බැරි වෙලා තියෙන්නෙ .???. මෙන්න විශ්‍රාමික මහ බැංකු සේවකයන්ගේ සැබෑ තත්ත්වය. යුතුකම් හා නැතිකම් අතර හිරවෙලා ඉන්න විශ්‍රාමික සාමාජිකයන් බහුතරයකගේ ආර්ථිකය මේ වගේ බව රහසක් නෙමෙයි. මේ වගේ අඩු ලුහුඬුකම් ඉවසා දරා ගෙන සිට ජීවිතයෙන් සමුගත් 23 දෙනෙක් පසුගිය නිළවසර තුළ දී වාර්තා වෙනව. **වාර්තා නොවූ මියයාම් සංඛ්‍යාවත් එක්ක බලනව නම් 48 දෙනෙක් වෙනව**. මේ මිය ගිය සහ ඉදිරියේ දී මිය යා හැකි හැමෝම කිසිම දේකට සහභාගි නොවී ගෙදරටම වෙලා, ගල්ගැහුණු අතීතය පුළුවන් විදියට ස්මරණය කරමින් 'ඔහේ' ඉන්නව. ඒක හරියට උදාහරණයකින් කියනව නම් ගෙදර දොරේ අඩු ලුහුඬුකම්වල පීඩනය විඳදරා ගෙන ඉවසන 'අම්මා' කෙනෙක් වගේ 'ඔහේ' ඉන්නව. භාණ්ඩ සහ සේවාවන්ගේ මිල මට්ටම්වල සීග්‍ර ඉහළ යාමට ඔරොත්තු දීමට තරම් විශ්‍රාම වැටුප හෝ ජීවන වියදම් දර්ශකය ශක්තිමත් නැති වීම ලොකු කැක්කුමක් බහුතරයකට.

මහ බැංකු නිළධාරියෙක්, කාර්යමණ්ඩලයේ සාමාජිකයෙක්, බැංකු සේවකයෙක් වශයෙන් අතීතයේ තිබූ සමාජ ගරුත්වය, පිළිගැනීම, ආකර්ශනය අද රැක ගැනීම දැවැන්ත අභියෝගයක් වෙලා. අතීතය සමග ගල්ගැහුනෙ නිකම් නෙමෙයි. ඉතාමත් අල්පායුෂ්ක, ඉක්මණින්ම වාෂ්ප වෙන පුංචිම විශ්‍රාම වැටුපක් සමගයි.

එසේ වී තිබීම නිසාම නිවසින් බැහැරට නොයා 'ඔහේ' සිටිනවා විය හැකියි. මෙම යථාර්ථය මහ බැංකු අධිපතිතුමාගේ අවධානයට යම් පමණකින් යොමු වී ඇති අතර, තව දුරටත් එතුමාගේ කාරුණික අවධානයට මෙම ගැටලුව ලක් කිරීම නව විධායක කමිටුවේ කාර්ය කොටසකි.

## විශ්‍රාමිකයන්ගේ අත්පොත

සංවිධානයක සාමාජිකයන්ගේ සම්බන්ධීකරණය සඳහා අවශ්‍ය මූලික තොරතුරු කීපයක්වත් එකිනෙකා අතර රාශිගත වී තිබිය යුතුයි. ඒ අවශ්‍යතාව සඳහා සංගමයේ සමාරම්භයේදී අත්පොත් පිංචක් සැකසීම ඉතාමත් අගේ කළ යුතු කාර්යයක්. එය අප එකිනෙකා අතර සබඳතාවය අඛණ්ඩව පවත්වා ගෙන යාමට පාලමක් වුනා. එහෙත් වසර ගණනාවක් තිස්සේ මෙය යාවත්කාලින (update) වී නොතිබීම ලොකු ගැටලුවක්. ජ්‍යේෂ්ඨ සාමාජිකයන්ගෙන් සමහර කොටසක් ජීවිතයෙන් සමුගැනීම, තවත් පිරිසක් අළුතින් එකතුවීම, සමහරුන්ගේ පදිංචි ස්ථානය වෙනස්වීම, දුරකථන අංක වෙනස්වීම ආදී විවිධ කරුණු රාශියකින් මෙම පොත යාවත්කාලීන විය යුතුව තිබුණා.

එම අවශ්‍යතාව සපුරා ලමින් මහ බැංකු විශ්‍රාමිකයන්ගේ අත්පොත, ඔබ සැම සැපයූ තොරතුරු අනුව ඉතාමත් දුෂ්කරතා මධ්‍යයේ යාවත්කාලීන කොට, සෝබන ලෙසින් නිමා කොට ඔබ අතට පත් කිරීමට පසුගිය විධායක කමිටුව සමත් වුනා. සංවත්සර මහා සභාවට සහභාගි වූ සෑම දෙනාටම එය තිළිණයකුත් සමග නීතීඥ යූ. වසන්ත කුමාර(3514) මහතාගේ අනුග්‍රහයෙන් ලැබෙන්නට සැලැස් වූ බවද සතුටින් දැනුම් දිය යුතුයි.

ඒත් සංවත්සර මහ සභාවට පැමිනි

සංඛ්‍යාවට වඩා නොපැමිණි සංඛ්‍යාව වැඩියි. ඔවුන්ගේ අත්පොත තැපෑලෙන් එවීම වියදම් අධික මෙන්ම ලොකු වැඩ වෙලුමක් ද වනු ඇත. එබැවින් ඒ සඳහා නව විධායක කමිටුව විසින් ඒවා බෙදා හැරීම සඳහා සේ.දො. කරුණාරත්න හා ලීලා මෙ-ාහාන්සුන්දරම් යන මහත්ම මහත්මීන්ට පැවරුවා. එය ඔබ වෙසෙන කලාපයේ සංගමයේ නියෝජිතයා හරහා ලැබෙන්නට සලස්වනු ඇති. එය එසේ ලබා ගැනීමට කාරුණික වන්න.

## ප්‍රතිචාර

තවද, එම අත්පොතේ අඩුපාඩු තිබිය හැකියි. අප්‍රේල් 27 වැනි දින ඔබ අතට එය පත්කිරීම ඉලක්ක කර ගනිමින් නිමා කළ යුතු වූ නිසාම ඔබේ ඡායාරූප, වර්තමාන ලිපිනය, දුරකථන අංකය ආදිය ඉල්ලා ලිඛිතව දැනුම් දුන්නා. ඒත් බොහෝ  අය එම ඉල්ලීම නොතකා නොසලකා හැර  තිබුණු බවද කණගාටුවෙන් දැනුම් දිය යුතුමයි.

සියළුම සාමාජික සාමාජිකාවන්ගේ සුව, සතුට, පහසුව, සුභ සාධනය සඳහාම වූ යම් යම් කටයුතු සඳහා (විධායක කමිටුවක් විසින්) කරනු ලබන නිවේදන ආදියට ධනාත්මකව ප්‍රතිචාර දක්වන්නේ නම් , සංවිධාන කටයුතුවලට පහසුවක්. මේ සෑම කටයුත්තක්ම අප හැමගේම සාමුහික කටයුත්තක් බව අමතක නොකළ යුතුයි. නියමිත දිනකට, වේලාවකට අනුව සංවිධානය කරනු ලබන කටයුත්තකට (විනෝද චාරිකා, විශේෂ මහ සභා, සංවත්සර මහා සභා, අවමංගල අවස්ථා ආදියට) ඔබ සෑම ප්‍රතිචාර දැක්විය යුත්තේ නිවේදනයට අනුවය. එසේ නොවන්නේ නම් සංවිධාන කටයුතු අවුල් විය හැකි බව අමුතුවෙන් කිව යුත්තක් නොවෙයි.

## දේවස්ථානය, පියතුමා හා සභාපතිතුමා

දෙවියන් වහන්සේ ලෝකයට හා මිනිසාට මග පෙ-න්වන බවට විශ්වාසයක් තියෙනව. දෙවියන් වැඩ සිටින තැන දේවස්ථානයයි. එතැන ඉන්නව උතුම් පුද්ගලයෙක්. අදෘශ්‍යමාන දෙවියන්ගේ දෘශ්‍යමානය එතුමායි. අපි එතුමා හඳුන්වන්නේ 'පියතුමා' කියන ගෞරව නාමයෙන්. එතුමා හොඳ ගුරුවරයෙක්. පසුගිය දවසක අප විශ්‍රාමිකයන්ගේ සංගමයේ සභාපතිතුමාට එහෙම අගනා 'පියතුමෙක්' මුණගැහුනා. කථිකාවක් ගොඩ නැගුනා. ඒ කථිකාව මගින් විශ්‍රාමික ජන කොටස් ගැනත්, ඔවුන්ගේ අතීතයේ කැප කිරීම් ගැනත්, වර්තමානයේ අතීතය තුළ ගල් ගැහුණු විශ්‍රාමිකයන්ගේ 'අහිංසක කෙට්ටුර හීන' ගැනත් පියතුමා සංවේදී වුනා. බොහෝ වේලා නිහඬව කල්පනා කළ එතුමා අපූරු උපහැරණයක් මගින් තත්ත්වය පැහැදිලි කළා. අතීතයත්. අතීතයේ කැප කිරීම් ගැනත්, ඒ කැප කිරීම්වල වත්කම වර්තමානය බවත්. එහෙත් වර්තමානය විසින් අතීතය නොසලකා හැර ඇති බවත් එතුමා පැහැදිලි කළේ 'අයියා සහ මල්ලී' යන උපහැරණයෙන්.

වත්ත පිටිය, ගහ කොළ. හරකාබාන, පාර තොට, පැංතොට, ළිංතොට, නානතොට, අටුව කොටුව, යානවාහන කියන සකල විධ වත්කම් තව තවත් වැඩි දියුණු කර ගන්න දෑතේ වීරියෙන් මව්පියන්ට උදව් පදව් කළේ වැඩුමල් පුතා. මේ වත්කම් කලඑලි වුනාට පස්සෙයි ඒ පවුලට 'බාල පුතා' එකතු වෙන්නෙ. දැන් මව් පියන් බාල පුතාම තමයි හුරතල් කරන්නෙ. නුමුහුන් නැවුම් කිරි ටික දොවල දෙන්නෙත් බාලපුතාට. ලොකු පුතා ගැන කථා නෑ. එයා අතීතයට තල්ලුකරල. හැබැයි! අයියගෙ හිතේ මල්ලිල ගැන අබමල් රේණුවකවත් අහිතක් නෑ. ස්වභාව ධර්මයේ හැටි එහෙම තමයි කියල අයිය දන්නව.

අතීතයට තල්ලුවුන අසරණ අයියට තමන් ගොඩනගාපු වත්කම හෙවත් බූදලෙන් ලැබුනෙ නිසරු, වියලි, ගල් බොරළු සහිත ඉඩමක්. ඒත් මල්ලිට සරුසාර මල්ගොමු සහිත දියසිරා ඇති ඉඩමක්  ලැබුණ.

අයිය ඉල්ලන්නෙ! මව් පියන්ට කියන්නෙ!! මව් පියන්ගෙන් කන්නලව් කරන්නෙ සමානව සලකන්න කියල නෙමෙයි. අයියලාටත් පොඩි දිය සීරාවක්  දෙන්න කියලයි. දෙමව්පියන්ගෙ

වත්කම්වල හැටියට අයියලාට තව ටිකක් දෙන්න පුළුවන්. දුන්නයි කියල කලබැගෑනියක් වෙන්නෙත් නෑ. මොකද වයස්ගත අයියල තව වැඩිකලක් ඉන්නෙත් නැහැනේ. ඉන්නකම් 'පවුලෙ' නම්බුව රැකගෙන මව්පියන්ගෙත් නම්බුව රැකගෙන ඉන්න පුළුවන් විදියට යමක් ලැබුණොත් ඇති වේවි.

මෙන්න මේ උපහැරණය තමයි පියතුමා දේවස්ථානයේදී පැහැදිලි කළේ. දෙවියන් වහන්-සේ බොහෝ විට මිනිස් වෙසින් මහ පොළොවට ඇවිල්ල සමහර කරුණු නිරවුල් කරනව කියල සමහරු  විශ්වාස කරන්නෙ ඒකයි. ඒ එක්කම භගවත් ගීතාව කියන අගනා ග්‍රන්ථයේ සඳහන් වෙනව ''**යුක්තිය මිය යනදාට දෙවියන් ඉපදෙනවා**'' කියල. විශ්‍රාමික මහ බැංකු සේවක පිරිස තමන් වෙනුවෙන් දෙවියන් වහන්සේ අත පොවන තුරු නෙත් දල්වා බලාගෙන ඉන්නව.

## ඉදිරිපත් කළ යෝජනා

කල් දී ඇති යෝජනා සාකච්ඡාවට බඳුන් කිරීම සාමාන්‍යයෙන් සංවත්සර මහා සභාවකදී සිද්ධවෙන දෙයක්. මෙවර මහා සභාවටත් ඒ වගේ යෝජනා 06 ක්ම ඉදිරිපත් වෙලා තිබුණා. මේ යෝජනා හැම එකක්ම (2 හැර) සලකා බැලීමේ දී පේන්නෙ විශේෂයෙන්ම විශ්‍රාමිකයන්ගේ ආර්ථික අපහසුතාවයන්ට කිසියම් විදියක පිළියම් යොදා ගැනීමට වෙන් වූ යෝජනා වැඩියි වගෙයි.

අද දවස 'ඩිජිටල්' කිරීම සඳහා ඊයේ දවස පුරාම කල්පිරී වයෝවෘද්ධ වී අතීතය තුළ ගල්ගැසෙනා තෙක්ම අත්හුරු ක්‍රමයෙන් (Manual) වැඩ කන්දරාවක් කළ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගෙ සෞඛ්‍ය තත්වය පිරිහීම නොවැලැක්විය හැකි ධර්මතාවක්. ඒ නිසා වෛද්‍ය පරීක්‍ෂණ සඳහා ඇති පහසුකම් තව තවත් නම්‍යශීලි මට්ටමකට ගෙන ඒමටත්, දියවැඩියාව, ස්නායුගත රෝග පර්යේෂණ සඳහා ඇති ගාස්තු ඉහළයාම දරාගත හැකි මට්ටමකට වැඩ පිළිවෙළක් සැකසීමත් යෝජනා අතර සාකච්ඡා වුනා. පවතින වෛද්‍ය පර්යේෂණ සේවා මිල මට්ටම් විශාල වශයෙන් ඉහළ යාම ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට දරාගන්න  අමාරුයි. ඒ පර්යේෂණ වියදම් දරා ගැනීම සඳහා වෙනත් දෙයක් කැප කළ යුතුමයි.

මේ ආර්ථික අපහසුව නිසා තමයි විශ්‍රාමිකයන් බැංකු ණය පහසුකම්වලට ආකර්ශනය වෙලා තියෙන්නෙ. කල් දී ඇති යෝජනා වලින් වැඩි වශයෙන් සාකච්ඡා වුනේ බැංකු ණය පහසුකම් ගැනයි. රටේ මූල්‍ය පද්ධතිය තුළ ඇති සමහර රාජ්‍ය බැංකු විසින් අවම පොළී අනුපාතයකට ලක්‍ෂ 5 ක උපරිමයකට යටත්ව ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට ණය පහසුකම් ලබා දෙනවා.

ප්‍රථම වතාවට තමයි රටේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් කේන්ද්‍ර කර ගනිමින් මෙහෙම ණය සැපයුමක් ක්‍රියාත්මක වෙන්නෙ. මේක ඉතාමත් සහනශීලි ආර්ථික මෙවලමක් විදියටයි ආර්ථික අපහසුකම්වලින් පරිපීඩිත විශ්‍රාමිකයන් දකින්නෙ. ඒ වගේම දැන් රටේ ජනගහන ව්‍යුහය තුළ වයස්ගත වූ ජනගහන ස්ථරය පුළුල් වී ඇති බව විද්‍යාත්මක සත්‍යයක්. ඒ නිසා අතීතයේ රට ගොඩනගමින් වර්තමාන 'මල්ලිලාට' ඉඩහසර ලබා දී අතීතයට එක් වූ ජ්‍යෙෂ්ඨ 'අයියලාට' හා 'අක්කලාට' තව තවත් ආර්ථික සහන ලබා දීම ජාතික යුතුකමක් බව යළිත් සඳහන් කළ යුතුමයි. **යුතුකමක සුවඳ දසත විහිදී පැතිරී යන්නේ එය ඉටු කරන්නාගේ සත්පුරුෂ හෘද සාක්ෂියේ සුවඳ ද මුසු කරගෙනයි.**

**- සංස්කාරක -**



# අවමංගල්‍ය සහනාධාරය හා සංගමයේ පැවැත්ම

සක්‍රිය සේවාවේ සිටින විට මහ බැංකුව තුළ ක්‍රියාත්මකව පැවති අවමංගල්‍යාධාර විධික්‍රම නොහොත් අරමුදල් ක්‍රම ගැන (සේවාවේ යෙදී සිටි) හැමෝම දැනුවත්ව සිටියහ. ඒවා අතර බැංකුව විසින් අනාදිමත් කාලයක සිට පවත්වාගෙන එනු ලබන මහ බැංකුවේ මරණ සහනාධාර ක්‍රම, බැංකුව තුළ පිළිගත් වෘත්තීය සමිතියක් වන මහ බැංකු සේවක සංගමයේ අවමංගල්‍යාධාර ක්‍රමයට අමතරව, ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගිය අයගේ මරණාධාර ක්‍රමය, විශ්‍රාමිකයන්ගේ සංගමය මෙහෙයවන (සාමාජික) විශ්‍රාමික වැටුපෙන් දායක වන මරණාධාර ක්‍රමය ආදී වශයෙන් පවත්නා මරණාධාර ක්‍රමය ද සහිතව මරණාධාර ක්‍රම රාශියකි. කිසියම් සාමාජික මරණයක දී මෙම සියළුම ක්‍රම මගින් මුල්‍යමය හෙවත් මුදලින් ආධාරයක් කරනු ලැබේ. එය ලබා දෙන්නේ මිය ගිය සංගමයේ සාමාජිකයා වෙනුවෙනි. එහෙත් ඒ මුදල් ආධාරය හිමිවන්නේ ජීවත්ව සිටින (නම් කරන ලද) අයෙකුටයි. යමෙකු දැනටමත් මේ ක්‍රම තුළ දායකත්වය ලබා නැත්නම් දායකත්‍වය ලබා ගැනීම සහනාධාරයට හිමිකම් ලැබීමකි.

## දායකත්ව මරණ සහනාධාරය.

විශ්‍රාමික ඔබ විශ්‍රාමිකයන්ගේ සංගමය මෙහෙයවන විශ්‍රාමික වැටුපෙන් දායකවන මරණාධාර ක්‍රමයට බැඳී නැතිනම් බැඳෙන්න. මේ අනුව සංගමයේ සාමාජිකයනට තම කැමැත්ත අනුව අයදුම්පතක් පුරවා මෙම මරණාධාර ක්‍රමයේ සාමාජිකත්වය ලබාගත හැකිය. මෙහිදී මෙම මරණාධාර ක්‍රමයේ සාමාජිකයෙකු මියගිය විටදී පමණක් එක් අයකුගෙන් රු.30 ක් විශ්‍රාම වැටුපෙන් අයකරගෙන එකතු වූ මුදල මියගිය සාමාජිකයා නම්කළ පුද්ගලයාට ගෙවනු ලැබේ. දැනට මෙම මරණාධාර ක්‍රමයට බැඳී ඇත්තේ 250 කට ආසන්න සුළු පිරිසක් පමණි. ඒ නිසාවෙන් මෙම ක්‍රමය යටතේ දැනට ගෙවන්ට හැකිව ඇත්තේ රු.7500 ක් පමණ සුළු මුදලකි.

මෙම මරණාධාර ක්‍රමය අපට තව බොහෝ දුරට පුළුල් කළ හැකිය. විශ්‍රාමික සංගමයේ සාමාජිකයන් 1000 කට වැඩි පිරිසක් දැනට සිටිති. මේ සියළුදෙනාම මේ ක්‍රමයට දායක වුවහොත් රු.30 බැගින්, රු. 30,000 ක් ගෙවීමට හැකි වේ. යම් විධියකින් දායක මුදල රු.50 ක් කළහොත් රු. 50,000 ක් එකතු වේ. මේ විධියට සාමාජික සංඛ්‍යාව වැඩිකිරීමෙනුත්, දායක මුදල වැඩිකිරීමෙනුත්, ප්‍රතිලාභ වැඩිකරගැනීමට පුළුවන.

## මෙම ක්‍රමය වැඩිදියුණු කළ යුත්තේ ඇයි?

සංගමය දැනට මරණාධාර වශයෙන් සාමාජිකයන්ගෙන් අයකරගන්නේ නැතිව සාමාජික මුදලින්ම පමණක් රු. 25,000 ක් ගෙවන ක්‍රමය තව කොතෙක් කාලයක් පවත්වාගෙන යන්ට හැකිවේදැයි සැක සහිතය. මියයන සාමාජික සංඛ්‍යාව වැඩි වෙන්ට වෙන්ටම සංගමයේ අරමුදලින් විශාල කොටසක් මේ සඳහා වැයවේ. විශ්‍රාමික සංගමයේ පැවැත්මට මෙය දැරිය නොහැකි බරකි.

දායකත්ව මරණාධාර ක්‍රමයේදී කෙනෙකු මියගියවිට ඒ පුද්ගලයා වෙනුවෙන්ම අනෙක් අයගෙන් මුදල් එකතුකර මියගිය අය වෙනුවෙන් මරණාධාර ප්‍රදානයක් කරන බැවින් සෘජුවම මියගිය පුද්ගලයා වෙනුවෙන් යම් දායකවීමක් හා යුතුකම් ඉටුකිරීමක් සුළුවෙන් හෝ කිරීමට ඔබට අවස්ථාවක් සැලසේ.

සහෝදර සාමාජිකයන්ගේ අවසන් අවස්ථාවට සහභාගිවීමට බොහෝවිට අවස්ථාවක් නොලැබෙන ඔබට, ඔබ සමග එකට කටයුතු කළ සහෝදර සාමාජිකයෙකු වෙනුවෙන් යම් යුතුකමක් (සුළුවෙන් හෝ) ඉටුකිරීමට මෙම ක්‍රමයෙන් ඉඩකඩක් ද සැලසේ.

එමෙන්ම මෙම ක්‍රමය තුළින් හැමටම ප්‍රමානවත් මුදලක් ලබාගත හැකි වන්නේ සාමාජිකයින් වැඩි දෙනෙක් බැඳුනහොත් පමණයි. සමහර කෙනෙකුට මෙය සුළු මුදලක් වුවත් එය මහ ලොකු මුදලක් සේ සළකන අය බොහොමයක් සිටි. විශ්‍රාම වැටුපෙන් එක් අයෙකුගෙන් කැපෙන්නේ සුළු මුදලක් වුවද එය එකතු වූ විට සැළකිය යුතු මුදලකි.

එබැවින් ඔබටත්, ඔබගේ සහෝදර සේවකයින්ටත් යහපතක් සිදුකිරීමට ඉවහල්වන මෙම මරණාධාර ක්‍රමයට ඔබ තවම බැඳී නැත්නම්, අදාල අයදුම්පත් පුරවා සංගමයේ ලේකම්ට එවීමෙන් මෙම සමාජ සත්කාරයට දායක වන්න.

# නව විධායක කමිටුව හා මරණ සහනාධාර

සංගමයේ 2013 වාර්ෂික වාර්තාවේ 14 වැනි පිටුවේ සඳහන් වූ පරිදි අප සාමාජිකයන් 23 ක් මිය ගොස් ඇත. ඒ උදෙසා 2013 දෙසැම්බර් 31 දිනට 575,000/- ක මුදලක් සහනාධාර වශයෙන් ගෙවා ඇත.

තවද 2014 ජනවාරි සිට මැයි මස 31 වන දින වනවිට තවත් සාමාජික සාමාජිකාවන් 19 දෙනෙක් මිය ගියහ. ඒ 19 දෙනා සඳහා රු. 475,000/- ක මුදලක් ද ගෙවා ඇත.

උක්ත සියළුම ගෙවීම් සිදුකර ඇත්තේ සාමාජික මුදලින් විනා මරණාධාර සඳහා වූ දායක මුදලකින් නොවන බව ද සඳහන් කළ යුතුය. සංගමයේ පැවැත්ම උදෙසා වන අනෙකුත් වැඩ සඳහා ඇති වියදම් සමග ඒකාබද්ධ කර සසඳ බලන විට පෙනී යන්නේ ශේෂ පත්‍රයේ ඍණ ශේෂයක් පවතින බවයි.

## සහනාධාර ලැබූ 19 දෙනා...

1) ආර්. ශන්මුගනාදන් මයා - 249
2) එස්.ඒ.දහනායක මයා - 951
3))ජී.වී.එස්. පෙරේරා මිය - 33
4) ඩී.එම්.කේ. දිසානායක මයා - 3027
5) බී.එල්. ප්‍රනාන්දු මයා - 166
6) ඒ.අයි. ද සිල්වා මිය - 386
7) මල්ලිකා කුරුප්පු මිය - 714
8) එස්.ජී. ලොකුබාලසූරිය මිය - 585
9) ලයනල් සිල්වා මයා - 495
10)ටී.එන්. මිස්කින් මයා - 591
11)ජී.එච්.ඒ.ප්‍රනාන්දු මයා - 315
12)සී.ජේ. රණසිංහ මයා - 1156
13)එන්. නඩරාජා මයා - 219
14)ඩබ්.එච්.ජේ. රාජවසම් - 185
15)එන්.එච්. කරුණාරත්න මයා - 846
16)පී.එම්. සේනාරත්න මයා -
17)ලතා දයාවංශ මිය - 777
18)ටී.ඒ. ඇග්නස් පෙරේරා මිය - W & OP
19)එස්. ධර්මවර්ධන මයා - 514

## සංගමයේ හෙට දිනය

ඔබේ කුඩා සාමාජික මුදල සංගමයේ එදිනෙදා කටයුතු සඳහා නම් ප්‍රමාණවත් කර ගත හැකිය. එදිනෙදා වැඩ කටයුතු වශයෙන් හඳුන්වන්නේ රෝගීවූ සාමාජික සාමාජිකාවන් බැලීමට යාම, ඔවුන්ගේ සරළ සුභසාධන කටයුතු කිරීම, විනෝද චාරිකා, කමිටු රැස්වීම්, විශේෂ මහ සභා රැස්වීම්, මහා සභා රැස්වීම්, සන්නිවේදන කටයුතු, මුද්‍රණ කටයුතු, ලියාපදිංචි ගාස්තු, තැපැල් ගාස්තු, ප්‍රවාහන වියදම්, ලිපි ද්‍රව්‍ය, උත්සව සංවිධානය කිරීම, ආගමික වැඩ සටහන් කිරීම, අවශ්‍ය වුවහොත් නීතිඥ ගාස්තු ආදී කී නොකී විවිධ අංශයන් යාවත්කාලීන කරමින් පවත්වාගෙන යා හැකිය. එහෙත් එය ප්‍රමාණවත් නොවන්නේ මරණාධාර ක්‍රමයක් ද පවත්වාගෙන යාමට සිදු වීම නිසායි.

මෙම අතිමහත් වැයබරෙන් නිදහස් වීමට නම් කළ යුත්තේ 'විශ්‍රාම වැටුපෙන් රු.30/- ක මුදලක් පමණක් (අවස්ථාවක දී) අයකරන - දායකත්ව මරණාධාර ක්‍රමයේ සාමාජිකත්වය ලබා ගැනීමයි. ඒ පිළිබඳ විස්තර ඉහත පිටුවේ හා 'සැඳෑව' පැරණි කලාපවල ද පෙන්වා දී ඇත.

එමගින් ලැබෙන මුදල, දැනට විශ්‍රාමිකයින්ගේ සංගමයේ සාමාජික මුදලින් ප්‍රදානය කරනු ලබන රු.25,000/- ක මුදලට වඩා වැඩිය. සාමාජික සංඛ්‍යාව හා දායක මුදල රු.30/- ට වඩා වැඩි කර ගන්නේ නම් සහනාධාරය තවත් ඉහළ අගයක් ගනු ඇත.

එසේ වන්නේ නම් මහ බැංකු විශ්‍රාමිකයන්ගේ සංගමයේ 'හෙට දිනය' ශක්තිමත්ව පවත්වා ගෙන යා හැකි වනු ඇත.





ආරියදාස තන්ත්‍රිගේ
(071 8064238.)

පැදි විදි පැදි විදි පැදි විදි

## සුවඳ මල - ලතා ......!



දහසක් පැතුම් මැද හසරැලි පැවාය
සහසක් කම්කටොළු බිඳ ජය ලැබුවාය
දුක්-සැප සොයා සැමගේ කල් ගෙවුවාය
මහ බැංකුව සුවඳ කළ "මල" නම් ඇය

මහ බැංකුවේ සෙවනින් පිටවූ විටම
දහසක් දෙනා යළි එක්කොට පෙරලෙස ම
රස කවි මඟින් නිති සනසා හුන් නිතිම
ඇය නික්මී ගොසින් - පාළුයි "සැඳෑව" ම!



ප්‍රේමා චන්ද්‍රසේන - 3137

# දෙව් සබය බාරේ ලතා නැගණියට ලැබිය යුතුයි

දෙව්ලොව දෙව් සබේ දෙවගන අතර සිට
එවු පැදි හසුන ලැබුණා, නැගණියනි මට
හදිසියෙ ඔබ ගියත් දෙව්ලොව විමන කට
කවිකම ඔබේ දිදුලයි මෙහි හතර වට

උදුරාගෙන අපෙන් ඔබ පසුගිය දාක
දෙව්ලොව සක් දෙවිඳු වරදක් කළ සේක
ඔහුගේ කවි සබය විය ඒකා ලෝක
"සැන්දෑ" සබය රැය මෙනි සඳ නැති දාක

ප්‍රේමා, අබේ, රේමන්ඩ්, සහ විමලාද
බර්නි ද, ජගත්, යසනායක, අමරේද
ආදින් "සැඳෑ" කවි පෙරහැර තුළ යෝද
සිටිය ද ඔබෙ අඩුව පිරිමැසියැකි වේද?

මීමන, කුඩලිගම, පී. බී. කුමර ගම
චිත්‍රානන්ද, කරු අයියා අනගි තම
පෙර කල කොළඹ යුගයේ කවි - කිවිඳි හැම
දෙව්ලොව කවි මඩුව තුළ බව දනිමි මම

ප්‍රේමකිත්ති, මානවසිහ සේකරද
මැතදි ඊට එක් වූ ඇත්තන් නොවෙද?
ඒ හැම දෙනාගේ කවි කම අතරහිඳ
තවමත් නැගණියනි, ඔබ කවි ලියනවද?

සිටි මුත් පරෙවි යුවලක් සේ, හදිසියෙන
ඔබටත් කලින් දෙව් සබයට ඇතුළුවුණ
ආදර දයා, ඔබෙ පෙම්බර කණකමිණ
සැනෙකින් වැළඳ ගත්තද, ඔබ හැඳිනගෙන?

කොටි රැළ එදා බැංකුව අබියසට පැන
බිලිගත් අපේ සොහොයුරු කැල සියලු දෙන
දෙව් සබයේ සිටිති, හැම වසරක ම මෙන
අප සිහිකරන බව ඔවුනට කියනු මැන

හිතවත් කමින් ඔබ මෙහිදී ඇසුරු කළ
ජොසෆින්, බණ්ඩාර, හේමා මිතුරු කැල
ඔබටත් කලින් රැඳුණිය දෙව් සබය තුළ
දුටුවද, ඔවුන් එහි මෙහි සැරි සරන කල?

බැංකුවෙ ඇතැම් අය යා යුතු අපායට
වැරදීමෙන් පැමිණ ඇත දෙව් සබාවට
සක් දෙවිඳුට ඔවුන් පෙන්වා මනාකොට
පියවර ගත මැනවි, උන් එහි යැවීමට



ලාල් හේවාපතිරණ (151)
(071-4357606)

# මරණය

# Death

ඉනූ හැකි විට පසුකරන් විත් සවි බල ඇති තරුණය
තැනූ දහමම දැනුම් දෙයි ඔබ වියොව පල නැත පරණය
යනූ වෙයි කිය නැතොත් දිවි මැද පැතූ පැතුම් අත් හැරුනය
ගනූ දෙනුවයි උපන්නෝතින් සැමට නියමයි මරණය.

සකල දෙයමත් සෑදී තිබෙනා විශ්වයේ මේ සුවිසල්
කිකල හෝ නැති වෙලා යන්නෙය නොතිර බව වෙනස වීමුල්
රැකිල තිබුණට කල්ප නොතිබෙයි තරු ඉර සඳ සදාකල්
පතල නියමය ඇතිව නැතිවෙනු සලස් වයි ලොකු පොඩි සියල්

සදා කල් හිම ඉන්න සිතුසේ වස්තු සම්පත් ලඟ තියන්
බදා ගෙන මෙනි මුදල් දේපොල නොතක එන අය දුක කියන්
නඳා කර සිත් සුබපබෝගිව සිටීයත් පරිමින් ලියන්
රඳා නොසිටිය කිසිවෙකුත් ලොව නැසී යයි මය නෙත් පියන්

පිනී බිඳු ලෙස මිණී කැටවී දිලී වියැලෙන හිරු දුටා
වැනී බබලන පහන් දැල්ලව පහසුවෙන් නිවි පව නටා
පෙනී පෙනී සිට සිහින පැතුමන් මැව්ව දිවියේ සැප වටා
හනී කට විත් යන්න කැඳවුම නැසෙයි අප දිවි බොහො විටා

මෙලොව විසුමට නියම කාලය බීජයෙහි මත් ලියවිලා
පරව වැටෙ ඔබ ඉන් එහා ගිය මොනව තිබුනත් අත්වෙලා
පෙමව වැඩුමට අලුත් ජීවිත ඉඳී සොබ දම ඉඩ බලා
දෙනුව ඒ ඉඩ අපේ මරණය ඇවැසි අවසානය වෙලා


බාලෙ ලා දලු ගස් හි අතු අග වැඩෙයි කඩිනමෙ දී ඔපේ
තාලෙ නල සල හරිත පැහැ කොල අහර තැනුමෙන් ගස් යැපේ
ආලෙ ජීවිත කලක් ගෙවලා සේවෙ දී ගස් වෙත කැපේ
කාලෙ පසුවී ඉදී වැටෙනා කැලෑ කොල ජීවිත අපේ

හරය ඇති නැති සොඳුරු අඳුරූ මිනිස් ජීවිත නෙකාවේ
වරය කාලෙන් දික් හො කෙටි හෝ ලබන් රඟනා භූමි කාවේ
තිරය වෙන් වුම අපෙන් මලවුන් දැඩි නිහැඬිය රැකාවේ
තිරය පිටුපස සැඟව යන මෙනි රඟා දිවි වේදිකාවේ



ඩබ්ලිව්. ඩී. ඒ. රේමන්ඩ් (554)
(011-2231357)


Who ever lives must one day die
Great or small they end in your claws
Death the agent of immutable laws
In what you do who will question why
To them either giving ample time
Or with suddenness lightning like.
As your master bids death you strike
Disregard bud stage old age or the prime.
But death you are a necessary end
For the world to be a hospitable one
And each has to part his part having done
In the time great system would lend
However glorified with life it is a must

That dust returns to rest in the dust.




W.D.A.Raymond.(554)
(011-2231357)

# අපූරු යෝජනාවක් !

අසදිස තිලෝගුරු හිමි ලොව අවදි කළ
වැඩසිටි අවදියක කොසඹෑ නුවර තුළ
පිවිසි මහ මගට දහවල පැමිණි කල
වැඩියා පිඬු පිණිස නොම සිඳ ගෙපිලි වෙල

මහ බඹු මුවෙන් දිනූ බව ගෙනහැර පාන
මාගන්දියා බමුණෙකි දැරු කුළ මාන
සොයමින් දියණියට සැමියෙකු අසම මාන
පසුවෙයි දිවා රැය නිති දකිමින් සින

තෙදවත් විපුල රුව සපුවෙන් අසම සම
දකිමින් බුදුහිමි ගෙ රුවකය අසිරි තම
දුටුයෙමි සුදුසු සැමියෙකු දියණියට මම
තුටුවෙයි මුලාවෙන් අඳ බල බමුණු තෙම

කැඳවා දියණි විගසින් මන වඩන රැකි
පවසයි මෙසේ බමුණා පා අදර බැති
හමුවිය ඔබේ සහකරු අඩු ලුහුඬු නැති
විසඳනු ඔබේ ඉරණම ඔහු සමග එති

දියණිය මගේ රුවයුත් රන් රුවක සම
සුදුසුය ඔබට පතිනිය මෙන් සොඳුරු තම
සිටුවා රන්රුවන් මුතු මිණි විසිරු බිම
අත පැන් දොවා පාවා දෙමි විගස මම

බැමිණිය සිරුර සළකුණු සිප් සතර දනි
බුදුහිමි බිම එබූ පදලස් ලකුණු මනි
උතුමෙකු මෙබඳු ලොව්තුරු පින් කඳක වැනි
බමුණුගෙ බසට නොනැමෙන බව ඇයට පෙනි

දෙතිසක් කුණප පිරි කුණු කය දුගඳ හැමි
දෙපයින් පවා පහසනු මම නොරිසි වෙමි
නොමගෙන වෙහෙස හරසුන් අරමුණක නැමි
ඔබගේ නිවට නොසරුප් බස් කරනු නිමි

බමුණා සිටි මවිතව මුව දෙනෙත අයා
කුපිතව බමුණු යුවතිය රකුසියක නියා
කළ අවමානයට මම පළි ගනිමි කියා
දෙනෙතින් නැගී කඳුළු පිස පිස ගෙදර ගියා

පී.වත්තේගම (451) (011-2864505)

(මෙම පද්‍ය නිර්මාණය සැඳුව - පැදිවිදි සංග්‍රහයට යොමු කළේ ඒ.ඩී.ඩී.ප් අබේවීර (507) මහතා විසිනි)

---

## කුඩු හෙවනැලි

ඉහින් කනින් බේරෙන අගහිඟ කම ට
පන පොද ගැට ගසන ඉළ ඇට කුඩුව ට
අලගුව තබන්නටවත් බැරි සොව්වම ට
**ආයු වඩ්ඩකෝ තව එක දවසක ට**

ඔබට කලින් ලැබූ ජන්මය වැරදියි ද
අත්හුරු කමින් කළ වැඩ ටික නරකයි ද
කල්පිරි බවට කී සංගුව නුහුරුයි ද
**වැඩිහිටියන්ගෙ හෙවනැලි තව කුඩු වෙයි ද**

ඉන්නේ හිත හිතා පෙර කළ දේ දැයට
කන්නේ අඳින්නේ මේ ලෙස මදි කමට
යන්නේ මග තොටේ නොගිහින් බැරි කමට
**පින්නේ ගැස්ම හඳ පායනු නැති කමට**

හින රහයි මනසට චිත්තර පටිය
පාන දුරයි එළි ලංකර ගනු බැරිය
ජේන දුරයි වා පොද ගිලිහෙනු ළඟය
**ගාන කුඹියෙක් වුව අලියෙක් සමය**

පිපුණොත් මලක් ගස් වැල් හැඩ වෙනවාමයි
පිපි මල් වලින් ගස නිසි පල දෙනවාමයි
පල ඇති ගසට සියොතුන් ලං වෙනවාමයි
**පිං පෙත් ආයු දෙන්නේ ගෙඩි ලැබුනාමයි**



යසනායක සිරිවර්ධන
(1306)
නිකවැරටිය.
(0112843902/
0714433208)



## ඔබ තවමත් සුවඳ මලෙකි


විශ්‍රාමිකයා ගිලන්ව සයනයේය. මෙම සයනය එදා ඔවුන්ගේ මංගල යහන ද විය. කිසිවෙකු ඔහු අභියස හිඳ ඔහු දෙස බලා සිටියි. ඇගේ නෙත් කරුණාබරය. ස්නේහයෙන් පිරී ඇත. සියල්ල වෙනස් වී ඇත. එහෙත් මේ ඇයමය. තමා එදවස ඇයට ලියූ මේ කවි අකාලික යැයි විශ්‍රාමිකයා සිතයි.

සුදු වළාකුලෙකට
මුවා වෙනු එපා ඔබ
ඔබ මගේ සඳ මඬල
දැක ගන්න බැහැ එවිට

නිලඹරේ තරු සමග
මුසුවෙන්න එපා ඔබ
ඔබ මගේ රන් තරුව
සොයා ගන්නට බැහැ එවිට

දෙපස මල් පිපි දෙවැට
මඟ හරිනු එපා ඔබ
ඔබ මගේ සුභ දසුන
හමු වෙන්න බැහැ එවිට

සුවඳ මල් බුරුත්තක
සැඟ වෙන්න එපා ඔබ
ඔබ මගේ සුවඳ මල
සිප ගන්න බැහැ එවිට



ටී.ඒ.ජී. ගෝමි (624)
(011-2926374)

## පැදිවිදි



## - ඩොක්ටර් නෙවිල්-

වෙහෙසක් නොවේ දැරූ සරූ කර ගන්න    මඩී
දඩි බිඩි ගමන් තිබූ බිම හප්පමින්    අඩී
මුහුණේ සිනහවක් රැඳුනේ නැතත්    වැඩී
කිව් දේ කරපු දේ හරියට වගෙයි    වෙඩී

දත් කම, උගත්කම, බොදුකම සිහල    නද
උරුමය වෙලා තිබුණා ලේ වලට    කිඳ
නිසි තැන හඹාගෙන ආවත් කඩුලු    බිඳ
**නිලතල බලා නැහැ ලොකු මිනිසුන්ට    වැඳ**

ගත යුතු අඩිය ගන්නට බියවුණේ    නැත
කේවට්ටයින් අතරට හිර වුණේ    නැත
දෙටුවන් දකින්නට නෙත පැකිලුණේ    නැත
කළවුන් කරනවුන් ලෙස වෙන් වුණේ    නැත

ඇඟකට නොගෙන කෙනෙහිලි කම්    විඳිමින්න
තිබූ කාලයෙදි එකතැන කොටු වී    ඉන්න
සිසු දරුවන්ට දිය හැකි දේ හරි    දෙන්න
තුන හතරකින් වැඩි වෙනනැති පොත්    ගොන්න

දොරකඩ බැම්ම බිඳ ලන්නට හැදුව    දිනේ
පෙන් වූ එඩිය තවමත් මතකයට    ගෙනේ
ඒකෙනි දහස් ගණනක දිවි ඉතුරු    වුනේ
**දිරි ඇති පුතෙකු දැයකට නැති අඩුව    දැනේ**



පේමදාස අතාවුද (3146)
(011-2928944
077-3410528)


## අකුරු උගනී කුමරි සොඳවා !

අකුරු හරඹ කරණු පිණිස
සිප් හල වෙත යන්න කලින්
හෝඩි පොතේ මුල් අකුරම
හොඳින් හැඳින සුබ නැකතට



අකුරු කියූ !

පුංචි "කෙනු" වෙසක් සඳවති
නෑදෑ සිත් සතුටු කෙරූ
පැන්සලයට නුහුරු අතින්
"අ" යනු ලියා සුදු කොලයක
දෙගුරුන්ගේ සිත් සනසා
හෙට දවසේ සිප් සයුරෙන්
මුතු අරගෙන නොයෙක පාට
එකිනෙක ගෙන අමුණාගෙන
සරසවියගේ වරම් ලබා
රටට අවැසි - දැයට හිතැති
හොඳ උගතෙක් වෙන්න දුවේ !



ජගත් කාරියවසම් (1215)
(038-2236643
077-9507184)

### පසුගිය කලාපයේ........

2014 ජනවාරි/ මාර්තු **සැදෑව** කලාපයේ නම වැනි පිටුවේ පළ වූ 'ජීවිතේ සුන්දයි' නම් වූ ලිපිය රචනා කරන ලද්දේ **ගාමිණී චන්ද්‍රසේන** විසින් බවත්, 'පැදිවිදි' සංග්‍රහයේ 'මිණිබිරිය' නම් වූ කාව්‍ය නිර්මාණය **ජගත් කාරියවසම්** ගේ බවත් දන්වමු.

කතෘ නාමය පළ නොවීමෙන් වූ ප්‍රමාදදෝෂය ගැන අපගේ බලවත් කනගාටුව මෙයින් පල කරමු.

- සංස්කාරක

# විශ්‍රාම වැටුප



සුමණසිරි රාජ්‍ය සේවයේ සුළු සේවකයෙකු වශයෙන් සේවය කරමින් සිට විශ්‍රාම ගියේය. ඔහු සිය බිරිඳ සමග විවාහක ලොකු දුවගේ නිවසෙහි පදිංචි වී සිටියේ ඇයගේ විශේෂ ඉල්ලීම නිසාය. ඈ සුමණා නමින් හැඳින්වෙනු ලැබුවාය. මෙසේ සිටින අතරතුර, ඔහුගේ විවාහක පොඩි දුවට ද, ඔහුගේ විශ්‍රාම වැටුපෙන්, ඔහු උදව් උපකාර කළේ ඇයට මුදල් අතින් හිඟපාඩුකම් තිබුන නිසාය. ඈ කරුණා නමින් හැඳින්වෙනු ලැබුවාය. සුමණසිරි කරුණාට එසේ උදව් උපකාර කිරීම සම්බන්ධයෙන් සුමණා කැමැත්තක් දැක්වූයේ නැත.

" හම්" අපි අම්මටයි තාත්තටයි කන්න බොන්න දෙනව. ඒ වුනාට මොකද, තාත්ත පෙන්ෂන් එකෙන් නංගිලාගෙ ගෙදරටයි උදව් කරන්නේ. අපිත් ජීවත් වෙන්නෙ අමාරුවෙන් " යි සුමනා දිනක් සිය සැමියාට කීවාය.

"තාත්තා එහෙම කරන්නෙ නංගිලාට සල්ලි අතින් කරදර හින්ද වෙන්නැති. ඒ වුනත් අපිත් මේ ඔක්කොම කරන්නෙ අමාරුවෙන් තමයි. ඉතින් ඔයා ගෙදර වියදමටය කියල තාත්තගෙන් සල්ලි ටිකක් ඉල්ල ගන්නකො. අපි ඒ දෙන්නට කන්න බොන්න දෙනව නං තාත්ත අපේ ගෙදරටත් වියදම් කරන්න එපායැ. ඔයා තාත්තට කෙලින්ම කියන්න." යි ඔහු කිවේය.

"අනේ මන්ද, කටක් ඇරල ඒක කෙලින්ම කියන්න පුළුවන්ද?" යි ඈ කීවාය. කෙසේ වෙතත් එය තම පියාට කීමට ඈ ඉටාගත්තාය.

"තාත්තෙ වෙලාවක් එනකං බලාහිටියෙ තාත්තට කාරණාවක් කියන්න." යි සුමණා තම මව සහ පියා සිටි කාමරයට ගොස් කීවාය.

"ඒ මොකක් ද දුවේ ?"

" තාත්ත දන්නව ඇතිනේ අපි මේ ගේ හැදුවේ ණයක් අරන්ය කියල. ඉතින් ඒ ණය හැම මාසෙම මහත්තයාගේ පඩියෙන් කැපෙනව. ඉතින් තාත්තෙ මං මෙහෙම කිව්වට මොකවත් හිතන්න එපා. නංගිට නං ඉතින් එහෙම ප්‍රශ්නයක් නැනෙ. ඒ ගොල්ලන්ට මහත්තයගෙ තාත්තගෙන් අයිතිවෙච්ච ලොකු ගෙයක් තියෙනවනෙ. මං මේ නිකමට කිව්වෙ තාත්තෙ. මොකවත් හෙම හිතන්න එපා." යි සුමණා කිවාය.

ඔහු එය නිහඬව අසා සිටියා විනා කිසිවක් කිවේ නැත.

"මේ ඇහුනද. මොකක්ද මේ ලොකු දුවගෙ කතාවෙ තේරුම ?" යි සුමණා එතනින් ඉවතට ගිය පසු සුමණසිරි සිය බිරිඳගෙන් ඇසුවේය.

"අපි දෙන්න මෙහෙන් නිකන් කකා බිබී පොඩි දුවට උදව් කරනවට ඊරිසියාවෙ. නැත්තං මොකද? අපි ලොකු දුවට අපට පුළුවන් තරමට දෑවැද්දක් දුන්න. ඔයා පෙන්ෂන් යනකොට එකසැරේ ඔයාට හම්බ වෙච්ච සල්ලි ටිකත් ඔක්කොම දුන්න ගෙයි ඉතුරු වැඩ කර ගන්නය කියල, දෙයියනේ අපි දෙන්නම ඉන්නෙ මෙහෙ නේද කියල. පොඩි දුවට එයාගෙ කැමැත්තෙන් කරගත්ත විවාහයනෙ කියල අපෙන් කියල එක ශතයක් දුන්නෙ නෑ. ලෙඩක් දුකක් හැදුනහම ගන්න අපටය කියල සල්ලි ටිකක් ඉතුරුවෙලා තියෙන්නත් එපායැ." යි ඔහුගේ බිරිඳ කීවාය.

" ඔන්නොහෙ ඉඳල හිටල ඔය කන බොන දේවල් ටිකක් ගෙනත් දෙන්න. නැතුව හොඳ නැනෙ. අපි දෙන්නම මෙහෙන් කනව බොනවනෙ." යි ඔහු කීවේය.

" මේ ඇහුනද, ලොකු දුව දැන් කීප දවසක්ම නැති බැරි කම කිව්ව. ඔය වෙන මොකවත් නෙමෙයි, පොඩි දුවට අපි උදව් කරනවට ඊරිසියාවෙ අපි දැන් මෙහාටත් බඩු ටික ටික ගෙනත් දෙනවනෙ." යි ටික දිනකට පසු සුමණසිරිගේ බිරිඳ ඔහුට කීවාය.

" මං කියන්නං වැඩක්, තනිකාමරයක පොඩි ගෙයක් හොයාගෙන අපි එහාට යමු. හන්දියෙ මුදලාලිගෙ කඩේට යාව එහෙම ගෙයක් තියෙනවා. ඒක දැක්කහම තමයි මගේ ඔළුවට ඒ අදහස ආවෙ. ඔහෙ මොනව හරි එකක් හදාගෙන කාල අපේ පාඩුවෙ ඉන්න පුළුවනි." යි ඔහු කීවේය.

" මාත් ඕක හිතුව. ඔයාට හම්බ වෙන මේ පෙන්ෂන් එක හින්ද මේ දෙන්න අතරෙ තරඟෙ. ඔය මොකවත් නෙමෙයි ඊරිසියාව. පොඩි දුවත් කැමති

නෑ අපි මෙහෙ ඉන්නවට. එයා කියන්නෙ එහාට එන්න කියල. ඒක හින්ද අර කිව්ව වගේ ඒ ගේ ගැන අහල අපි ඒකට යමු. එතකොට ඉවරයිනෙ." යි ඈ කීවාය.

ටික දිනකින් එය ක්‍රියාත්මක විය. සුමණසිරි සිය බිරිඳත් සමග, කුලියට ගත් එම නිවසෙහි විසීමට පටන් ගත්තේය. ඔවුහු පෙර පරිදිම කරුණාට උදව් උපකාර කළහ.

සුළු කාලයක් ගතවීමෙන් පසු සුමණසිරිගේ බිරිඳ තදබල ලෙස අසනිප වී මිය ගියා ය. ඇයගේ අසනිපය සහ අවමංගල්‍ය කටයුතු සඳහා ඔහු ළඟ තිබුන සම්පූර්ණ තැන්පත් මුදල වියදම් විය.

"තාත්තෙ දැන් ඉතින් එන්න අපේ ගෙදර, එහෙ ඉඩකඩ ඕනැ තරං තියෙනවනෙ. මම තාත්තව හොඳට බලාගන්නං. අපට දැන් ඉස්සර වගේ මුදල් අතින් එහෙමට කරදරයකුත් නෑ."යි ඔහු ඒ ගෙදර තනිවීමෙන් පසු, කරුණා පැමිණ ඔහුට කීවාය.

" ඔව් මාත් හිතා හිටියෙ එහෙම තමා. මට ඉතින් ඔය ගෙදර දොරේ තියෙන පොඩි පොඩි වැඩක් තවම කරන්න පුළුවනි. අපි එහෙනං එහෙම කරමු පොඩි දුවේ." යි ඔහු කී පසු, ඈ ඔහු කැන්දන් තම ගෙදරට ගියාය.

" අම්මා නැතිවුනායින් නංගිට තවත් හරි ගියා. තාත්තගෙ පෙන්ෂන් එක එයා දැන් තනියෙම ගන්නව ඇති."යි එයින් මාස තුනකට පමණ පසු, සුමණා තම සැමියාට කීවාය.

''පෙන්ෂන් එක කෑව වගේ නෙවෙයි, තාත්තගෙ අනිත් දේවලුත් එයාම බලාගන්න ඕනැ". යි ඔහු කීවේය.

"ඒ මොනවද ?

"නෑ ඉතින් මං කිව්වෙ ලෙඩ දුක් හැදුනාම, ඒවත් එයාම බලාගන්න ඕනැ. එක අතකට ඔහොම වෙච්ච එක හොඳයි" ඔහු කීවේය.

"එහෙම කියල කොහොමද ? අපි දෙන්න දවසක ගිහින් තාත්තව මෙහෙ එක්කර ගෙන එමු. අපි කියමු ටික කාලෙකටයි කියල."යි ඈ කීවාය.

"අනේ මට බෑ ඔය ලැජ්ජ නැති වැඩ කරන්න. ඔයත් එක්ක කතාවක් ඇතිකරගෙනනෙ අම්මයි තාත්තයි මෙහෙන් ගියේ. මට නං බෑ. ඔයාට ඕනැ නං ගිහින් තාත්තව එක්කර ගෙන එන්න." යි ඔහු කීවේය.

" අනේ තාත්තෙ මාස දෙක තුනක් හරි ඉන්න දැන් ඉතින් යමු අපේ ගෙදර. මං තාත්තව හොඳට බලාගන්නං. එහේ ඉතින් මෙහෙ වගේ අතුගාන්න මිදුලක්වත් ලොකුවට නැනෙ. මෙහෙ වගේ තාත්තට කරන්න අපේ ගෙදර වැඩක් නෑ. මටත් ඉතින් දවල් කාලෙ හරි පාළුයි." යි එයින් ටික දිනකට පසු ඈ කරුණාගේ ගෙදරට ගොස් තම පියාට කීවාය.

" වෙනසකටත් එක්ක ඒක හොඳ තමා. මාස දෙක තුනක් විතර ඉඳල ආපසු එන්න බැරියැ. දැන් අම්මත් නැති එකේ එයාටත් ආස ඇතිනෙ මාව ටික දවසක් බලාගන්න."යි ඔහු සිතුවේය.

"පොඩි දුවේ, මම එහෙනං ලොකු දුවගෙ ගෙදර මාස දෙක තුනක් ඉඳල එන්නං." යි ඔහු කීවේය.

"හා තාත්තෙ, තාත්තගෙ කැමැත්තක්."යි කරුණා ඉතාමත් කැමැත්තෙන් කීවාය

ඇය එසේ කීවේ ඉතා කැමැත්තෙන් බව තේරුම් ගත් සුමණා ඒ ගැන පුදුම වූවාය.

"තාත්ත දැන් එයාටත් කරනව ඇත්තෙ ඉස්සර අපට කරපු දේම වෙන්නැති. පෙන්ෂන් එක වියදම් නොකර එහෙන් කනව බොනව වෙන්නැති. ඒක හින්ද වෙන්නැති තාත්ත මෙහෙ එනවට එච්චර සන්තෝෂ, එකත් එකට තාත්තව එයාට එපාවෙලා වෙන්නැති. මීට පස්සෙ පෙන්ෂන් එක ගන්න යන්නෙ මාත් එක්කනේ. මං එදාට තාත්තගෙන් කීයක් හරි ඉල්ල ගන්නං. දැන් ඒකට හරස් වෙන්න අම්මත් නැනෙ." යි සිතමින් ඈ ඉතාමත් කැමැත්තෙන් ඔහු කැන්දන් ගෙදර ගියාය.

ඔහු එහිදී පෙර නොලද තරම් සැලකුම් ලැබුවේය. ඇයගේ ආදරයෙන් ද අඩුවක් නොවීය. මෙසේ ටික දිනක් ගතවීමෙන් පසු ඔහුගේ විශ්‍රාම වැටුප ලබා ගන්නා දිනය උදා විය.

" තාත්තෙ අද පෙන්ෂන් එක ගන්න දවසනෙ. ඒක නංගිලාගෙ දිහාවෙ බැංකුවකට හරව ගත්තය කියල ඒ දවස් වල කිව්වනෙ. තාත්තව තනිවම යවන්න බෑ. මම තාත්තව එක්කරගෙන යන්නං බැංකුවට."යි ඈ ඉතාමත් කරුණාවෙන් කීවාය

"ඔයා කරදර වෙන්න එපා ලොකු දුවේ. ඒක පොඩි දුවගෙයි මගෙයි නම් වලට ගිණුමකට හරවලයි තියෙන්නෙ. ඒකත් ඕනැ දවසක පොඩි දුවටත් ගිහින් සල්ලි ගන්න පුළුවනි. මා යන්න ඕනැනෑ."යි ඔහු කීවේය.

"මදැයි කොලා. එහෙනං ඒකයි නංගි බො-හොම කැමැත්තෙන් තාත්තව මට එක්කරගෙන එන්න දුන්නෙ."යි ඈ සිතුවාය.

" තාත්තෙ, තාත්තව මං මෙහෙ එක්කරගෙන ආවෙ ටික දවසකටනෙ, නංගිලගෙ ගෙදර ආපසු යන්න ඕනැ වුනහම මට කියන්න තාත්තෙ. මං ගිහින් ඇරලවල එන්නං." යි සුළුවෙලාවකට පසු ඈ කිවාය.

" අපොයි මේ පෙන්ෂන් එකක් තින්ද මට මහ කරදරේ. ඒත් ඒකත් නොතිබුනා නං මට කාගෙ පිහිටක්ද."යි ඔහු සිතුවේය.

" ලොකු දුවේ මට තනියෙම ගියහැකි මං යන්නං." යි ඔහු කීවේය.

" හා තාත්තෙ."



පී.ඩී අබේපාල (583)
(011 -2868849)



# අධිපතිතුමාගෙන් ආදර්ශයක්



හද යොෟවනයේදීම, (වයස අවුරුදු 18 දී) වෘත්තිය ජීවිතයට පිවිසිලා, අවුරුදු 31 ක්ම පෞද්ගලික අංශයේම තමයි සේවාවෙ යෙදිල තියෙන්නෙ. ඒ වරලත් ගණකාධිකාරීවරයෙක් හැටියටයි. ඉන් පස්සෙ තමයි ඔහු රාජ්‍ය සේවාවට එකතු වෙන්නෙ. මුලින්ම අමාත්‍යාංශ ලේකම්වරයෙක් හැටියටයි. ඊටත් පස්සෙ තමයි ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිධූරයට පත් වෙන්නෙ. ඔහු තමයි මහ බැංකුවෙ 12 වෙනි අධිපතිතුමා.

ඔහුගේ පියා ඒ කාලෙ ඔහුට මග එළි පෙන්වමින් කියපු මසුරං කියමනක් ඉතාමත් ගෞරවයෙන් හා නිහතමානිව මෑතකදී සිහිපත් කළා. එහෙම සිහිපත් කිරීමක් කරන්න හේතු වුනේ 2014 මැයි 25 ඉරිදා උදේ රූපවාහිනී සම්මුඛ සාකච්ඡාවකදී මාධ්‍යවේදිනියක් ඔහුගේ නිහතමානී බව පිළිබඳව ප්‍රශ්නයක් නැගූ අවස්ථාවේදියි. මෙන්න ඒ කියමන.

**"ඉහළට යන කොට මුණ ගැහෙන හැමෝම සමග සුහදව කථා කරන්න. සමහර විට පහළට එන කොට ඒ අය නැවත හමුවේවි"**

විශ්‍රාම ගිය දිනෙක කරන්නේ කුමක්දැයි එම මාධ්‍යවේදිනිය කළ ප්‍රශ්න කිරීමට ද එතුමාගේ පිළිතුර කදිම ආදර්ශයක්.

**"මම දන්නා කාලෙ ඉඳල හැම දේකටම පූර්ව සූදානමක් තියෙනව. හෙට කරන්න ඕන දේ අද සටහන් කර ගන්නව. ලබන මාසේ, ලබන අවුරුද්දෙ, තව අවුරුදු පහකින් පවා කරන දේ සැලසුම් කරනව. එතකොට කල්පනා කර කර එක තත්පරයක්වත් නාස්ති කරන්න ඕනෙ නෑ. කාලය හරියට වටිනව. මම විශ්‍රාම ගියාමත් එහෙමයි. පොත් ලියනව. අළුත් අදහස් ලෝකයට එකතු කරනව"**

- සංස්කාරක -

# *Sandewa* - OUR PAGE

To breath in new life to the magazine and more to widen the member participation in the contributing of articles to it, we hope to introduce a new feature into Sandewa. That section will accomodate and reflect your past experiences and shiny capabilities if only you will write to us. Your descriptions may include your hobbies, ideas and views, experiences, capabilities, and even draw backs and disappointments if yu opt to tell them.

Sandewa is your own magazine. You dont have to shy away from it. We want more and more of you to write for it and make it yours. With your compositions kindly send both a new photograph of you and an old one to make you better known among the readers. (Please see page 19.)

Whom to send your writings,

| | | |
|---|---|---|
| Sinhalese | - Amarapala Karasingha Arachchi | - 56/5, Jayasri Place, Galthude, Panadura (038 - 2234226) |
| Tamil | - Mrs. Leela Mohan Sundaram | - 521/1G, Galle Road,Colombo 06. ( 011- 2360665 ) |
| English | - W.D.A. Raymond | - 98/3, Negombo Road, Kandana. ( 011 - 2231357 ) |

---

# සැඳෑව - අපේ පිටුව...

නොසිතූ විරූ ලෙස නවීන තාක්ෂණික භාවිතාවන් මානව සමාජයේ වැඩකටයුතු පහසුකර තිබේ. එය මානව සංහතියේ විශිෂ්ඨ ජයග්‍රහණයකි. රට පුරා බොහෝ වැඩ කටයුතු කාර්යක්ෂම ලෙස කරගෙන යාමට හේතු වී ඇත්තේ මෙම තාක්ෂණික භාවිතාවන්ය. එහෙත් සමීප අතීතය වනතෙක් රටේ බොහෝ වැඩ කටයුතු කෙරුණේ දෑතේ වීරියෙනි. අත්හුරු (Manual) ක්‍රමයෙනි. මහ බැංකුව ද එසේමය. මහ බැංකු කටයුතු විධිමත්ව හා නිරවුල්ව අත්හුරු ක්‍රමයෙන් ඉටු කරන ලද විශාල පිරිසක් වන විශ්‍රාමික සංගමයේ සාමාජික ඔබ ගැන ඔබටම වෙන් වූ විශේෂාංගයක් ඉදිරි ’ සැඳෑව’ කලාපයේ සිට පළකිරීමට අදහස් කරමු. ඒ සඳහා ඔබ මනාප නම් ඔබේ විස්තර, විශේෂ හැකියාවන්, බාහිර කටයුතු , විනෝදාංශ, අදහස් උදහස්, ජය හා පරාජයන්, අත්දැකීම් ආදිය සමග(ඇතොත්) අතීත ඡායාරූපයක් හා වර්තමාන ඡායාරූපයක් ද 'සැඳෑව' වෙත යොමු කරන්න. ඉඩ ලැබෙන පරිදි ’ අපේ පිටුව ’ ඔබේ තොරතුරු පළකරනු ඇත. (19 වෙනි පිටුව බලන්න...)

මෙසේ එවන්න

සිංහල - අමරපාල කරසිංහ ආරච්චි, 56/5, ජයශ්‍රී පෙදෙස, ගල්තුඩේ, පානදුර. (038 -2234226)
දෙමළ - ලීලා මොහාන්සුන්දරම් මිය, 521/1G, ගාලු පාර, කොළඹ 06. (011-2360665)
ඉංග්‍රීසි - ඩබ්.ඩී.ඒ. රේමන්ඩ් මහතා, 98/3, මීගමුව පාර, කඳාන. (011-2231357)

- සංස්කාරක -

# A baby elephant's dream

Chained to it I am under a tree
Though they give me enough to eat
Speak fondly and take good care
My mind flees to Yala forest
For the freedom and company there

On our long journeys in the forest
In search of new feeding grounds
Scenic beauty surrounds some lakes
But to see enough of them
Too short were our stops, breaks

Walking walking far in the forest
How my little legs would ache
When I stopped the legs failing
From the moving herd mother comes back
To urge with love the needed going

Mother to pet me and give your warmth
To suck sweet milk from your udder
To eat tasty grass your trunk offers
Come soon and redeem me
Please mother come,your son suffers

The sight of our seperation oh mother
To me is a lasting sorrow
your tearful eyes of the day
In my mind's eye still L see
Oh mother secretly come to take me away



**P. Dulman Pieris (1165)**

**MEANING OF ADOPTION**

Teacher was discussing a picture of a family to first Graders. One little boy in the picture had different colored hair than the others. Somebody suggested maybe he was adopted. A little girl said, " I know all about 'adoption' I was adopted." "What does it mean to be adopted ?" asked another child. " It means "said the girl, " that you grew in your mommy's heart instead of her tummy !"

..............................................................................

**CONTENTMENT EXPLAINED .......**

Whenever disappointed with my spot in life, I stop and think about little Jamie. Jamie was trying for a part in the school play. His mother told me that he'd set his heart on being in it, though she feared he would not be chosen. On the day the parts were awarded, I went with her to collect him after school. Jamie rushed up to her, eyes shining with pride and excitement.. 'Guess what, Mom.' he shouted, and then said those words that will remain a lesson to me..' I ' ve been chosen to clap and cheer'

....................................................................................

**Take Care**

There was a contest to find the most caring child. The winner was a four-year-old child. His next door neighbor was a elderly gentleman who had recently lost his wife. Upon seeing the man cry, the little boy went into the old gentleman's yard, climbed onto his lap, and just sat there. When his mother asked him what he had said to the neighbor, the little boy just said, 'Nothin, I just helped him cry.'

Source : Holy Trinity Community Magazine
**Sent by: Yvonne Amarasekera** (602)
(011-2645162)

# අපේ පිටුව අපේ පිටුව අපේ පිටුව



**සු**න්දරත්වය හැම දෙයක් තුළම ඇත. එහෙත් එම සුන්දරත්වය දකින්නට හැමෝටම නොහැකිය. එසේ වන්නේ සියල්ල විනිවිද දකින්නට තරම් වූ සංවේදී ඇසක් හැමෝටම නැතිකමයි. එවැනි දැක්මක් ඇත්නම් ඔහු සමාජයට දැනෙන ලෙස ජීවත්වන සැබෑ මිනිසෙකි. මහ බැංකු විශ්‍රාමික සංගමය තුළ එබඳු මිනිසුන් බහුලය, නවීන තාක්‍ෂණයෙන් තොරව, දෑතේ වීරියෙන්, දේශයේ උන්නතිය සඳහා දහදිය, කඳුළු හෙලා, අද ජ්‍යෙෂ්ඨ පුරවැසියන් ලෙස අතීතයට එකතු වී සිටින එබඳු දැක්මක් සහිත විශ්‍රාමික ඇසක් මෙන්න........!

කුලියපිටිය මධ්‍ය මහා විද්‍යාලයෙන් උසස් අධ්‍යාපනයට සුදුසුකම් ලැබූ ඔහු, වෘත්තීමය වශයෙන් මුලින්ම තෝරා ගත්තේ ගුරු වෘත්තියයි. 1965 දී මහ බැංකු සේවාවට එකතු වෙන ඔහුගේ නැඹුරුව ඇතිවන්නේ වැඩි වශයෙන් රූපකලාවටයි. ඒ විශේෂ ඇහැක් හා දැක්මක් ඇති නිසායි.

බැංකු සේවාවට අමතරව, පී.වැලිකල, ධම්සිරි වික්‍රමරත්න, රංජිත් ධර්මකීර්ති, ප්‍රේමරංජිත් තිලකරත්න වැනි ප්‍රවීන නාට්‍ය ශිල්පීන්ගේ නාට්‍ය කණ්ඩායම්වලට සම්බන්ධ වීමෙන් දැනුමක් හා පරිචයක් ලැබුවේය.

ඒ අතර රජයේ ලලිත කලායතනයේ ඡායාරූප ශිල්පය පිළිබඳව ඩිප්ලෝමාවක් හදාරා පුවත්පත් කිහිපයකම විශේෂාංග ඡායාරූප ශිල්පියෙක් බවටද පත්විය. 1968 දී ඔහු නිෂ්පාදනය කළ 'එක වහලක් යට' හා 1978 දී නිෂ්පාදනය කළ 'ජූලි' (ප්‍රේමරංජිත් තිලකරත්න සමග) ප්‍රේක්‍ෂක හා විචාරක පැසසුමට ලක් වූ නාට්‍ය දෙකකි.

මේ අතරතුර ඔහු සිනමාව පිළිබඳවද අධ්‍යයනයකට යොමු වේ. ඉන්පසු එම අධ්‍යයනය භාවිතයට ගනිමින් 'සිහින ලොවක්' හා 'ප්‍රියාංගා' යන වෘත්තාන්ත චිත්‍රපටවල සහය අධ්‍යක්‍ෂක වශයෙන් කටයුතු කළේය. විවිධ කලා ක්‍ෂේත්‍රයන් ගැන අධ්‍යයනය කරමින්, පියවරෙන් පියවර හදාරමින්, ප්‍රගුණ කරන දැනුම භාවිතයට ගත් ඔහු ප්‍රථම වරට කෙටි චිත්‍රපටයක් ද අධ්‍යක්‍ෂණය කළේය. 1970 දී අධ්‍යක්‍ෂණය කරන ලද 'තුන්දෙනෙක්' නම් වූ එම කෙටි චිත්‍රපටයෙන් සිනමා ක්‍ෂේත්‍රයේ සිටින ප්‍රවීනයන්ට ඔහු පිළිබඳව අනාගත සුභ ලකුණක් හෙළි පෙහෙළි වෙයි.

ප්‍රවීනයන්ගේ එම සුභ ලකුණ කල එළි විය. එනම්, කථාව දෙබස් හා තිරනාටකය ලියා ඔහු විසින්ම 1981 දී ' සතිපූජා ' නම් චිත්‍රපටය අධ්‍යක්‍ෂණය කිරීමයි. නලියන දක්‍ෂකම දිදුලන භාස්කමක් බවට පත් වෙමින් එම චිත්‍රපටය එවකට ජර්මණියේ 'මැන්හයිම්' ජාත්‍යන්තර චිත්‍රපට උළෙල වෙනුවෙන් ශ්‍රී ලංකාව නියෝජනය කළේය.

වර්තමානයේ ප්‍රවීන නිළි චාන්දනී සෙනෙවිරත්න සිනමාවට හඳුන්වා දුන්නේ 'සතිපූජා' යි. ඇයට 1984 දී නැගී එන හොඳම නිළියට හිමි ජනාධිපති සම්මානය ලබා දුන්නේ ද 'සතිපූජා' යි. ජර්මණියේ ප්‍රකට සිනමා විචාරක පී. වැලන්ටි මැතිනිය හා එම්. එල්.හෙබර් මහතා ද ශ්‍රී ලංකාව ගැනත් මේ පුංචි රටේ සිනමා නිර්මාණ කුශලතා ගැනත් ලන්ඩන් හා ජර්මන් සඟරාවල ලිපි පලකිරීමටත් ඔහුගේ 'සතිපූජා' පාදක කරගත්හ.



මීට සමගාමීව ඔහු මහ බැංකුව වෙනුවෙන් 'කඳුලක හසරැලි ' ටෙලි නාට්‍යය ඇතුළු තවත් වාර්තා වැඩ සටහන් කිහිපයක්ද අධ්‍යක්‍ෂණය කළේය. එමෙන්ම පොහොය දිනයන්හිදී විකාශනය කිරීම සඳහා 'සනාතන කතන්දර' මාලාව ද නිර්මාණය කළේ ඔහුමය.

ඔහු හිටි බව එවකට බැංකුවට දැනුනේය. ජීවිතය විනිවිදින්නට තරම් සංවේදී ඇසක් හිමි ඔහු වනාහි **විමල් රංජිත් ප්‍රනාන්දු** නම් වන්නේය.

# තිතක්, ඉමක් - නොමැති දුමක්

## නිමිත්ත :

සමාජ සදාචාරය, පුද්ගල සෞඛ්‍ය සංරක්‍ෂණය, යහ පාලනය, සාර්ව ආර්ථික වර්ධනය හා ස්ථායිතාව ආදී මාතෘකා වර්තමාන සමාජ කටගැස්මයි. නැතහොත් කාටත් තේරෙන භාෂාවෙන් කියන්නේ නම් 'Bite` එකයි. කටේ 'කිවුළ' හෙවත් 'අමිරහ' නැතිකර ගැනිමට ගන්නා 'සැපුම්' ඒකකයයි. උක්ත ප්‍රපංචයන් කටගැස්මට ගන්නේ බොහෝවිට නැණවත්, පැනවත්, ධනවත්, බලවත් සමාජ ඒකකයන් නියෝජනය කරන්නෝය. ඔවුහු වනාහි වියත්තු වන්නාහ. උගත්තු වන්නාහ. දේශපාලන බලය ඉදිරියටත් ගොනුකොට ස්ථාවරව තබා ගැනිමට වෙර දරන්නෝය. තමන් දැනට දරන නිලතල, තනතුරු රැක ගනිමින් තවත් මුදල් ටිකක්, වරදාන ටිකක්, විදේශ සංචාර ටිකක්, බදු සහන ටිකක් ලබා ගැනිමට සිහින මවන්නෝය. එමෙන්ම 'බල' පොරයට සමවැදී කුලල් කා ගන්නා දේශපාලනඥයෝය. ප්‍රකට අන්වර්ත නාමයකින් හඳුන්වන්නේ නම් ඔවුහු වනාහි 'මගෝඩිස්වරු'ම වන්නාහ.

උක්ත ප්‍රබුද්ධයන්ට අතිරේකව එබඳු මාතෘකා පූජාවට්ටියකට ගනිමින් යමක් කමක් කියන්නෝ ද නැතුවා නොවේ. ඔවුහු වනාහි සති කිහිපයකට, පමණක් තමන් සතුව තබා ගත් 'සර්වජන ඡන්ද බලය වසර ගණනාවකට, 'මගෝඩිස්වරුන්ට' උකස්කරන හෝ අලෙවිකරන හෝ පාවාදෙන පොදු ජනතාවෝය. අසරණයෝය. පසුගාමියෝය. දේශපාලන ගිනිකන වැටුනෝය. ඒ කෙසේ වෙතත්, සමාජ ප්‍රගමනය අපේක්‍ෂා කරන්නහුද වන්නෝය.

ඔවුහු බොහෝ විට - විශේෂයෙන්ම ධූමපානය, මත්පැන් පානය, මාංශ අනුභවය, සුදුව දුරාචාරය, වංචාව ගැන කතිකා කරති, ශක්ති පමණින් ලියති. පළකරති. මිනිසා විසින් තනාගන්නා ලද සංස්කෘතික රාමුව තුළ ඇති එවන් ප්‍රපංචයක් ගැන යමක් විමසා බැලීම උදෙසා මෙම වියමන (text) අමුණනු ලැබේ.

## සිගරැට් දුම

තම්බපණ්ණියට, තැප්‍රොබේනයට, සෙරන්ඩිබයට, සෙයිලනිකාවට, පලයි මුණ්ඩුවට හෙවත් ශ්‍රී ලංකාවට මුල් වටයේ දී 'සිගරැට්ටුව' හඳුන්වා දුන්නේ ඒවා නොමිලේ බෙදා දීමෙනි. උජාරුවත් සමග එවකට සිගරැට්ටුව මගින් පෞරුෂය මදක් ඔසවා තබන ගතියක් ද ප්‍රදර්ශනය කළේය. කාලයාගේ ඇවෑමෙන් සිගරැට් දුම බාධාවකින් තොරවම දස අත පැතිරී ගියේය. එම දුම නගර, ගම්, දනව්, පසල් දනව්, සිසාරා, ඉතිරී, පැතිරී, විසිරී යද්දී ඒවා නිෂ්පාදනය කරනු ලබන බහුජාතික සමාගම් සිය ලාභාංශය දිනෙන් දින පුළුල් කර ගත්තේය, එමෙන්ම සිගරැට් නිෂ්පාදන ආයතනයන්හි රැකිරක්‍ෂා සැපයීම, එම රැකියා වල වැටුප් හා වරප්‍රසාද ඉතාමත් ආකර්ෂණීය වීම, රජයට වාර්ෂිකව විශාල බදු මුදලක් හිමි වීම, සිගරට් බෙදා හරින නියෝජිත වෙළෙඳ ආයතනවල රැකියාවල් පවා බොහෝ වරප්‍රසාද සහිත වීම, රජයේ අයවැය ඉදිරිපත් කිරීමේදී නිශ්චිතවම, තිරසාරවම සිගරැට්ටුවේ මිල සත ගණනකින් වැඩි කිරීම ප්‍රසිද්ධ අයවැය රහසක් හා යෝජනාවක් වීම වැනි ප්‍රකට සංසිද්ධීන් එය කේන්ද්‍ර කර ගනිමින් පැණ නැගුන බව සත්‍යයකි. එදා සත ගණනක් වූ සිගරැට්ටුවක් අද රුපියල් 28 ක් පමණ වන බව වාර්තා වේ. එදා සතයකින්, සත 2 කින් හෝ සත 5 කින් පමණ අයවැයෙන් මිල ඔසවද්දී අද එය රුපියල ද අභිභවා යනු පෙනේ. මේ මගින් රටේ සංවර්ධන කටයුතු සඳහා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය දියත් කිරීමට ලැබෙන බදු ප්‍රමාණය අති විශාල

බව නොරහසකි, එමෙන්ම අය වැය යෝජනා ගෙන ඒමට දින කිහිපයකට පෙර සිටම වෙළෙඳපොළ තුළ සිගරට් හිඟයක් ඇතිවීමද සාමාන්‍ය සිරිතකි. එයට හේතුව අය වැය යෝජනා මගින් අනිවාර්යයෙන්ම මිල ඉහළ දමන බව වෙළෙඳ ප්‍රජාව හොඳකාරවම දන්නා නිසා තොග රැස් කිරීම හා සැඟවීම නිසාය. සිගරැට්ටුව බොහෝ ව්‍යාපාරිකයන්ට ධනය සොයා දුන්නේ එසේය.

## දුම මුදල් උල්පතක් ලෙස

නොසිඳෙන, නොවියලෙන උල්පතේ මූලික කර්තව්‍යය වනාහි පුරවා දීමයි. උතුරා යන්නට සැලැස්වීමයි. දුම් කැරැල්ලේ තිඹිරි ගෙය වන සිගරැට්ටුව ද අගනා ධන උල්පතකි. දෙන්න පටන් ගත් විට මදියි නොකියන්නම දෙයි. දෙන දෙයිෙ-යා් දෙන්න පටන්ගත්විට ටොකු ඇන ඇන දෙති, ගැලවිය නොහැකි වූ විට අලෙවිය වැඩිවේ. අලෙවිය වැඩිවෙන විට ලාභය වැඩිවේ. ලාභය වැඩිවෙන විට රජයේ බදු මුදල් වැඩිවේ. බදු මුදල් වැඩි වීමෙන් අය වැය පරතරය අඩුවේ. වාර්ෂිකව වැඩිවන බදු ආදායම ඉහළ යන්නේ නම් එය නතර කිරීමට කැමැති වන්නෝ කවුරුන්ද? පහත සඳහන් වගුව මගින් තහවුරු වන්නේ බදු උල්පතේ රටාවයි.

## සිගරැට් බදු වර්ධනය -

(මහ බැංකු වාර්ෂික වාර්තාවෙන්)

| වර්ෂය | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
| 30,067 | 31,437 | 37,288 | 37,601 | 40,675 | 49,623 | 58,525 | 62,920 |

රුපියල් බිලියන වලින්

රජයේ අඛණ්ඩ සංවර්ධන කටයුතුවලට, දේශපාලනඥයන්ගේ යැපීම් දීමනා වලට, ආණ්ඩු හිතවතුන්ගේ කොමිස් කුට්ටිවලට. වේතන හා සුභසාධන කටයුතු වලට සොච්චමක් එකතු කිරීමට තරම් මානව දයාවක් ඇති කිරීමට ද උක්ත බදු මුදල් හේතු කාරකයක් වන නිසා මෙම ආදායම් මාර්ගය නැති කර ගැනීමට ඉදිරිපත් වන්නෝ රටේ වෙසෙත් ද? නැත්තේමය.

වර්ෂ ගණනාවක් තිස්සේ ජන සමාජය තුළ බහුවිධ හැඩරුව පාමින්, නේකවිධ සුරුවිරුකම් කරමින්, නොයෙක් ලෙඩ රෝග පවා ජනිත කරමින් වැජඹෙන, මෙම ධූමය හෙවත් දුම් වාහකයා (සිගරැට්ටුව) අද වන විට ජන්ම හැඩය පවා වෙනස් කරගෙන ඇත. එය වෙනත් හැඩයකින්, අළුත් Style එකකින්, උඩු ගුවනින්, සාගරයෙන් රටවල් සිසාරා පැතිරෙමින් මහා ධනවතුන් බිහි කරමින් සිටී. රටක බලවත්කම හෙවත් ‘බලය’ ඒකරාශිවන දේශපාලන කප්රුක පහළ කර ගැනීමට ආකර්ශනීය සාධකය වන ‘සල්ලි’ උල්පත මේ හරහා වැටී තිබේ. එය නොදන්නා අය නැවත නැවත රැවටෙති. බහාලුම් හෙවත් කන්ටේනර් පිටින් ප්‍රාදුර්භූත වීම ද සාමාන්‍ය දෙයක් වී ඇත.

## සිගරැට්ටුවේ උපත

සාමාන්‍යයෙන් පැවැත්මක් ඇති දේකට උත්පත්තියක් හෙවත් හටගැනීමක් තිබිය යුතුය. ආඩම්බරකාර පෙනුමෙන්, අහංකාර හැසිරීමකින්, ජේත්තුකාර හැඩයකින්, වරෙක ආයතනගතව ද, වරෙක මග තොට එළිමහනේද, තවත් වරෙක මංගල අවමංගල සැසිවාරවල ද, වත්මනේ බොහෝ විට සැඟවීද, වරාය හා ගුවන් තොටුපළෙන් ද කළ එළි බසින ධූම වාහකය හෙවත් සිගරැට්ටුවට ද සුපැහැදිලි ජන්මයක් තිබේ. එම ජන්මය පහතින් දැක්වෙන සංසිද්ධියෙන් ඉතිහාසගතය.

බ්‍රිතාන්‍ය ජාතික වෝල්ටර් රැලේ එවකට හද යෞවනයෙකි. ඔහු සීතලෙන් පීඩා විඳිමින් නිවසේ ගිනි උඳුනට තුරුළු වෙමින් මෙන් සිටියේය. උඳුනට දර දමයි. තව තවත් රිංගවයි. ඇතුළට තල්ලු කරයි. බලා සිටියි. සීතලෙන් මිදෙන්නට උණුසුමට තුරුළු වෙයි. ඔය අතරතුර ලිපට දැමූ දර කෝටුවක නොදැවෙන කෙළවරින් දුම් ගොබයක් පිටවනු දකී. රටාවකට ගණ දුම්ගොබයක් පිටවීම ඔහුට ගෙන දුන්නේ කුතුහලකි. ඔහු දර කෝටුව අතට ගත්තේය. එය එක්තරා සිදුරක් සහිත දර බටයකි. බටයක හැඩයක් ගත් කෝටුවේ දැල්වෙන

කෙළවර ගින්දර සහිතය. අනික් කෙළවරින් දුම් කැරැල්ලක් පිටවේ. ගින්නක් නැතිව දුමක් නොනගින බව එවෙලේ ඔහුද තේරුම් ගන්නට ඇත.

ඔහු නොදැවෙන කෙළවර මුවට ළං කළේය. ඉන් නොනැවතුන ඔහු එය දෙතොළට තබා ඉරුවේය. දුම මුව තුළ පිරුණේය. ඔහු එය පිටට මුදා හළේය. යළිත් උරා බීවේය. පිට කළේය. දෙතුන් වතාවක් එසේ කිරීමෙන් ඔහුට කිසියම් 'ගතියක්' දැනුනේය. ඒ දැනුන ගතිය ප්‍රබෝධයක් ද, ප්‍රමෝදයක් ද, උත්තේජනයක් ද, උණුසුමක් ද, එසේත් නැතහොත් 'ආතල් ' එකක් දැයි දන්නේ ඔහුම පමණකි.

දිගින් දිගටම දුම් බට ඉරීම නිසා ඔහුගේ තොල් තුවාල විය. මුඛය දුම් වැදීමෙන් දුර්ගන්ධය වහනය වන්නට විය. ඔහුගේ දත් දුර්වර්ණ විය. එහෙත් දුම් ඉරීමෙන් සිතට හා ගතට දැනෙන 'ගතිය හෙවත් ආතල් එකට' තව තවත් ඇලුම් කළ වෝල්ටර් රැලේ විසින් තම හිතවත් මිතුරන්ට ද පුරුදු කළේය. එය මිතුරන් අතර ද ජනප්‍රිය විය. වැඩිහිටියන් අතර ද ජනප්‍රිය විය. කෝටු බට වෙනුවට කඩදාසි කැලි, ගණ ශාබ පත්‍ර වලින් සකසා ගත් බටයේ හැඩයක් තනා ගනිමින් දුම් උරන්නට බොහෝ අය සිරිතක් වශයෙන් පුරුදු වූහ.

දුම්කොළ යොදා, විසිතුරු කඩදාසි ඔතා ආකර්ෂණීය ලෙස නිමා වූ සිගරැට්ටුව ලොව පුරා පැතිරෙන්නේ ඉන් පසුවය. මෙය විදේශීය බලපෑමකින් හෝ අධිරාජ්‍යවාදීන්ගෙන් ලැබුණු නව යටත් විජිත උපකරණයක් හෝ කුමන්ත්‍රණයක් දැයි කීමට හඳිසි විය යුතු නොවේ. එහෙත් බටහිර රටකට සංචාරයකට ගිය ලංකාවේ දේශපාලනඥයෙක් පෙරළා දිවයිනට පැමිණියේ සුපුරුදු ලෙස බටහිර සංස්කෘතියේ අළුත්, පහසු, නම්බුකාර අංගයක් ඩැහැගෙනය. සිය බංගලාවට පැමිණි ඔහු සියල්ලෙන්ම සප්පායම් වී සිගරැට්ටුවක් ගෙන දල්වා ගාම්භීර දුම් රැල්ලක් උරා පිට කළේය. මේ ගැන හාන්කවිසියක් නොදන්නා ගෙදර සේ'වකයා කලබල වී කෑම මේසය උඩ තිබූ ඉඳුල් වතුර කෝප්පය ලොක්කාගේ ඔලුවට හැලුවේලු. ඒ ගින්න නිවීමටය.

වර්තමානයේ මෙම දුම් වාහකයේ හැඩය වෙනස් වී, එහි ආකර්ෂණීය පැකැට්ටුවේ දුම් පානයෙන් පිළිකා වැළඳෙන බවට රූප සටහන් ද පළ කරනු ලැබේ. සිගරැට්ටුවට එසේ වෙද්දී එම දුම් රැල්ල අද වෙනත් හැඩයකින් සමාජගත වී තිබේ. නමුත් ඒ දුම්මුලය කන්ටේනර් මඟින් ගෙන ආවත් රජයට (සිගරට් වලින් මෙන්) බදු අයවීමක් තවම නැත. එතෙක් මෙම මාතෘකාව කටගැස්මට ගැනිමට ඉඩකඩ තිබේ.

## සිගරැට්ටුව හා විකල්ප දුම්.

සමාජයේ සමහර ක්‍රියාකාරකම්වලට ඵලදායි අර්ථයක් නොමැත. අර්ථ ශූන්‍ය මෝස්තරකාර හැසිරීම් නම් අප්‍රමාණවම පවතී. දිනය වෙන් කර ගනිමින් අහවල් දිනය ලෙස එය හඳුන්වා දී එදිනට ඔන්න ඔහේ මොකක් හරි දෙයක් කිරීම සාමාන්‍ය මෝස්තරයයි. මැයි දිනය, ආදරවන්තයන්ගේ දිනය, ඒඩ්ස් දිනය, කාන්තා දිනය, මානව හිමිකම් දිනය ආදිය ඊට දිය හැකි හොඳම උදාහරණ රාශියකින් කිහිපයකි. සාධනීය ප්‍රතිඵලයක් නැති වුවද, ඊළඟ අවුරුද්දේදී ද එදිනට එම මෝස්තරකාරී ක්‍රියාව සිදු කරන්නේද පෙර පරිදිමය.

ජාත්‍යන්තර දුම්වැටි විරෝධී දිනය ද එබන්දකි. ජුනි මස 01 වැනි දින දුම්වැටි විරෝධී දිනයයි. හෘද පිළිකා, ළය පිළිකා, මුඛ පිළිකා පිළිබඳ සටන් පාඨ හා ජායාරූප සහිත බැනර් සමග චිත්තාකර්ෂණීය පෙළපාලි පැවැත්වීම වගවිය යුතු අංගවල සාමාන්‍ය මෝස්තරයයි. ප්‍රතිඵල රහිත වුවත් බැලූ බැල්මට මෙහි අන්තර්ගතය තුළ මොකක්දෝ බරකුත් දක්නට තිබේ. එහෙත් ........???

සිගරැට් දුමට වඩා අතිශය හානිකර, භයංකර, ව්‍යසනකාරී දුම් රැළි සමාජය පුරා ඉතිරී, පැතිරී, විසිරී ඇත. මේවාට සෘජු විරෝධතා නැත. රාජ්‍ය අනුග්‍රහයෙන් විරෝධතා නොපෙනේ. සිදුවන්නේ දුම් උරන්නන් කුදලෑම පමණි. දුම්

වාහකය ගෙන්වන්නන්ට රවා බැලීමක්වත් නැත. එක් එක් වරප්‍රසාද කබොල්ල නිසා කිසිවෙකු ඊට අත නොපොවයි. එම දුම්වාහක ඉදිරියේ, දේශිය ඖෂධ පැළෑටියේ සාවද්‍ය භාවිතාවන්ටද එරෙහිව දැවැන්ත මෙහෙයුම් නම් ක්‍රියාත්මකය.

කෙසේ නමුත් මේ දුම් ගොබ ඉරීමෙන්, උරන්නන්ගේ සෞඛ්‍යය පිරිහීම, දිරාපත් වීම, ක්ෂය වීම හා නොයෙක් රෝගවලට ක්ෂේමභූමියක් වීම මෙන්ම ආර්ථික ආබාධය ද සමාන්තරව ගමන් ගනී. සිගරැට්ටුවෙන්, ශාරීරික හානි සිදු වෙතත් ඊට වඩා වැඩි ශාරීරික, සමාජයීය හා ආර්ථික හානි කරනු ලබන විකල්ප (විදේශීය) දුම් වාහක පිළිබඳව සමාජය තවමත් සෘජු කටගැස්මකට නොගැනීම කාගේ අහේතුවක්දැයි නොතේරේ. එබඳු දිනයක් නම් කරන තුරු ඔන්න ඔහේ බලා සිටිමු.

## දුම හා වත්මන් තාරුණ්‍යය

සයිමන් නවගත්තේගම කවියෙකි. ලේඛකයෙකි. නාට්‍යකරුවෙකි. රූපවාහිනි වැඩසටහන් සම්පාදකයෙකි. දේශකයෙකි. දාර්ශනිකයෙකි. විචාරකයෙකි. පශ්චාත් නූතනවාදියෙකි. සුප්‍රකට මිනිසෙකි. සුප්‍රකට ඔහුගේ (අ)ප්‍රකට තොරතුරක් නම් ............... එක්තරා කාලයක ශ්‍රී ලංකාවේ වැඩිම සිගරැට් දුම් බොන්නා වීමයි. ඔහු දිනකට කොතරම් දුම් පානය කරන්නේ දැයි දක්වතොත් ලංකා දුම්කොළ සමාගමෙන් මාසයකට අවශ්‍ය සිගරැට් ප්‍රමාණයම නොමිලේ ඔහුට ලබා දෙන ලද බව දන්නෝ දනිති.

එක්තරා වකවානුවක ශ්‍රී ලංකා මහ බැංකුවේ මාණ්ඩලික නිළධාරීන්ගේ මේසය මත සිගරැට් අළු බඳුන් විය. සිගරැට් ඉරීම සාමාන්‍ය දෙයක් විය. ගෞරවය, පෞරුෂය, ආඩම්බරය සංකේන්ද්‍රණය වන හැසිරීම් රටාවක් විය. එහෙත් ක්‍රමානුකූලව සෞඛ්‍යය හා ආර්ථික හේතූන් මත අද වන විට තරමක් දුරට එම රටාව වෙනස් වී ඇත.

දිවයිනේ වත්මන් තාරුණ්‍යය දුම්වැටි ඉරීමෙන් ඈත් වී ඇති බවට කෙරෙන ප්‍රවාදයක් ද ඇත. විවිධ නම් වලින් වෙළඳපොළේ තිබුණු සිගරැට් ඉරීම දැනට බොහෝ දුරට තරුණ පරපුරෙන් ඈත් වී තිබිය හැකිය. එහෙත් අලුත් දුම්.............. ????

එහෙත් ශ්‍රී ලංකාවත්, ලොව පුරාත් විශේෂයෙන්ම දකුණු ආසියාව පුරාත් සිගරැට් දුම වෙනුවට ඊට වඩා හානිකර භයානක, මිල අධික, ධන කුවේරයන් බිහි කරන, සාමාන්‍ය දුම් උරන්නන් හිඟන්නන්, සොරුන් බවට පත් කරන, ව්‍යවස්ථාදායකයට නියෝජිතයන් තෝරන දේශපාලන ප්‍රචාරක වියදම් සියල්ල දරා ගත හැකි, බදු ගෙවීමෙන් ආවරණය විය හැකි නවතම දුම් විශේෂ මගින් වත්මන් තාරුණ්‍යය මත්වී සිටීම අසත්‍යයක් නොවේ. අමූලික සත්‍යයකි.

පුරුද්ද නිතැතින්ම අත්‍යාවශ්‍යතාවයක් බවට පත්වීම නොවැළැක්විය හැකිය. එය යහපත් දේට මෙන්ම හානිකර දේටද පොදුය.



**අමරපාල කරසිංහ ආරච්චි (1230)**
**(038 2234226)**



## Next Volume

Please forward all your writings (speciality Tamil & English) including articles, poems, stories, comedies etc., filled with your emotions, feelings, knowledge and creativity for the next volume of “sandewa”.

With that if you can send a recently taken Photograph of yourself with mentioning your name, it will be highly appreciated.

Editor

56/5.
“Amara-Mal”
Jayashri place,
Galthude,
Panadura.
038-2234226

### මීළඟ කලාපයට.....

සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන්ම ලියූ ඔබගේ ලිපි, කාව්‍ය, ප්‍රබන්ධ සහ හස රස බස් සහිත රචනා, කෙටියෙන් හා පැහැදිලිව ලියා "සැඳෑව වෙත ඉක්මණින්ම යොමු කරන්න.

එම නිර්මාණ සමග ඔබගේ නම සඳහන් කරන ලද, මෑතකදී ගනු ලැබූ ඡායාරූපයක් ද එවන්නේ නම් මැනවි.

- සංස්කාරක -

සැඳෑව
சந்தாவ

ශ්‍රී ලංකා
මහ බැංකු විශ්‍රාමිකයන්ගේ
සංගමය
2014 මැයි/ ජූලි කලාපය.



වෙබ් අඩවිය ඃ www.sendewa.org විද්‍යුත් ලිපිනය info@cbpa.com
අංක ඃ QD/168/News/2014 යටතේ ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලදී.

**ගරු ලේකම්,**
**මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමය,**
**116/2/1B, බෝ සමිදු මාවත, දොලේකනත්ත,**
**මහරගම පාර, පිළියන්දල.**

රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවත, අංක 58 දරණ ස්ථානයේ පිහිටි
ශ්‍රී ලංකා මහ බැංක මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදුව
ශ්‍රී ලංකා මහ බැංකුවේ විශ්‍රාමිකයින්ගේ සංගමය විසින් නිකුත් කරන ලදී.

Typesetting - **Graphicworld** - Panadura.
graphicworld.pan@yahoo.com